# සමාජ විග්‍රහ

# Samaja Viggraha

## ස්වර්ණජයන්ති සැමරුම්

## ශාස්ත්‍රීය සංග්‍රහය

## පළමුවන කාණ්ඩය-සිව්වන වෙළුම

1969-2019
50th Anniversary
COLOMBO SOCIOLOGY
Sociology for Everyday Life

සමාජ විද්‍යා අධ්‍යයනාංශය

කොළඹ විශ්වවිද්‍යාලය

# සමාජ විග්‍රහ

**විමර්ශිත සංග්‍රහය**
**REFEREED JOURNAL**
**2020 ස්වර්ණජයන්ති සැමරුම් කලාපය**
**ISSN 2362-0978 (print ISSN)**
**ISSN 2756-925X (e-ISSN)**

ලිපි අංක 04


## සමාජ සංවර්ධනයෙහි හිමිකරුවන්: ශ්‍රී ලංකාවේ වැදි සමාජයල සමාජ සංවර්ධනය සහ තිරසර සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ අභියෝග


*සමිත උදයංග*[1]


---


***ප්‍රධාන සංස්කාරක***

ප්‍රේමකුමාර ද සිල්වා

***සහය සංස්කාරක***

එම්.ඒ.දිශාන් මදුශංඛ

***සංස්කාරක උපදේශක මණ්ඩලය***

එස්.ටී.හෙට්ටිගේ (සම්මානිත මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
කාලිංග ටියුඩර් සිල්වා (සම්මානිත මහාචාර්ය) පේරාදෙණිය විශ්වවිද්‍යාලය
කේ.කරුණාතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) කැලණිය විශ්වවිද්‍යාලය
සරත් අමරසිංහ (සම්මානිත මහාචාර්ය) රුහුණු විශ්වවිද්‍යාලය
යසාංජලී ජයතිලක (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
චන්ද්‍රසිරි නිරිඇල්ල (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
සුභාංගි හේරත් (මහාචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය
නිශාර ප්‍රනාන්දු (ආචාර්ය) කොළඹ විශ්වවිද්‍යාලය

***භාෂා සංස්කරණය***

නාලක ජයසේන

***පරිසැලසුම් නිර්මාණය***

ප්‍රභාත් ගලගමගේ



[1] බී.ඒ. (පේරාදෙණිය) එම්.ඒ. (පේරාදෙණිය) බී.අයි.ටී. (කොළඹ) කථිකාචාර්ය, සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

# සමාජ විග්‍රහ


**විමර්ශිත සංග්‍රහය**

**REFEREED JOURNAL**

**2020** ස්වර්ණජයන්ති සැමරුම් කලාපය

**ISSN 2756-925X (e-ISSN)**

**ISSN 2362-0978 (print ISSN)**



This work is licensed under a Creative Commons Attribution-NonCommercial-NoDerivatives 4.0 International License.

දැනුම වෙත ප්‍රවේශ වීමේ සීමා අතික්‍රමණය සඳහා ලොව බොහෝ ශාස්ත්‍රාලයීය ප්‍රකාශන සම්ප්‍රදායික ප්‍රකාශන අයිතිය පිළිබඳ නෛතික ආකෘතියෙන් විකල්ප ආකෘතියක් වන පොදු නිර්මාණ බලපත්‍ර ක්‍රමයට සංක්‍රමණය වී / වෙමින් ඇත. මේ අනුව විචාරාත්මක දැනුමට විවෘත ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් "සමාජ විග්‍රහ" විමර්ශිත සංග්‍රහය, මෙම කලාපයේ සිට නිකුත් වන්නේ ඉහත පොදු නිර්මාණ බලපත්‍රය යටතේය.


## ලිපි විමර්ශක මණ්ඩලය


ජ්‍යෙෂ්ඨ මූලාසන මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා, *සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

මහාචාර්ය ෆර්සානා හනිෆා, *සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

මහාචාර්ය චාන්දනී ලියනගේ, *සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

මහාචාර්ය ඉරේෂා එම්. ලක්ෂ්මන්, *සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

ආචාර්ය දිල්රුක්ෂි අබේසිංහ, *සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*

ආචාර්ය එම්.ටී.එම්. මහීස්, *සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්ව විද්‍යාලය*

ආචාර්ය ජගත් බණ්ඩාර පතිරගේ, *සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්වවිද්‍යාලය*


## ප්‍රකාශනය


සමාජ විද්‍යා අධ්‍යයනාංශය

කොළඹ විශ්වවිද්‍යාලය

කොළඹ-03

දුරකථනය/ෆැක්ස්: 011-2500452

විද්‍යුත් තැපැල: samajaviggraha@soc.cmb.ac.lk

වෙබ් අඩවිය: https://arts.cmb.ac.lk/sociology/

# සමාජ සංවර්ධනයෙහි හිමිකරුවන් ?: ශ්‍රී ලංකාවේ වැදි සමාජය, සමාජ සංවර්ධනය සහ තිරසර සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධ අභියෝග

**සමිත උදයංග**

**සාරසංක්ෂේපය:**

සාධාරණත්වය සහ සමානාත්මතාව යනාදී මූලධර්ම පිළිබඳ යම් අවධානයක් පැවතියත්, විවිධ සාධක යටතේ සමාජ කොන් කිරීම හෝ නොසලකා හැරීම සංවර්ධන වැඩසටහන්වල කැපී පෙනෙන ලක්ෂණයක් බවට පත් වී තිබේ. මෙය ප්‍රධාන ප්‍රවාහයෙන් බැහැර සමාජ කණ්ඩායම්වල සුභසාධනය සඳහා, සමාජ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිදී ඉස්මතු වන මූලික ගැටලුවකි. 2030 න්‍යාය පත්‍රය (තිරසර සංවර්ධන අභිමතාර්ථ) යටතේ ආර්ථිකය, පරිසරය සහ සමානාත්මතාව පාදක කොටගත් තිරසර සංවර්ධනයක් ළඟා කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ. සංවර්ධනය වෙමින් පවතින සමාජ තුළ මේ සම්බන්ධයෙන්ද බහුවිධ ගැටලු ඉස්මතු වීමට ඉඩ ඇත. විශේෂයෙන්ම සුවිශේෂ සමාජ කණ්ඩායම්වල සුභසාධනය ස්ථාපනය කිරීමේ අභියෝගය ප්‍රධානස්ථානයකට පත් වී තිබේ. මෙම ගැටලුව ප්‍රතිපත්තිමය පර්යාවලෝකයක් සහිතව ශ්‍රී ලංකාවේ වැදි ප්‍රජාව ආශ්‍රයෙන් විවරණය කිරීම මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අපේක්ෂාවයි. අධ්‍යයනය සඳහා ජීවන අවකාශ මානවවංශවිද්‍යාත්මක ක්‍රමවේදය භාවිත කරනු ලැබිණ. විග්‍රහයෙහිදී ගම්‍ය වන්නේ ප්‍රධාන ප්‍රවාහයෙන් බැහැර සුවිශේෂ සමාජ කණ්ඩායම්වල සුභසාධන කටයුතු සඳහා හුදෙක් පොදු ප්‍රතිපත්ති රාමුවක් භාවිත කිරීම ගැටලු සහගත බවය. සංවර්ධන කාර්යයෙහිදී ආදිවාසී සමාජ කණ්ඩායම්වල ප්‍රාදේශීය අවශ්‍යතා කෙරෙහිද මූලික අවධානයක් යොමු වී නොමැත. තිරසර සංවර්ධන අභිමතාර්ථ පාදක කොටගත් වැඩසටහන්, දැනට ව්‍යුහමය වශයෙන් ආකෘතිගත වූ සමාජ ක්‍රමයන් තුළ ම ස්ථාපනය කිරීම සම්බන්ධයෙන්ද ගැටලු ඇතිවිය හැකි බව පෙන්නුම් කරයි. මේ සඳහා ඉලක්කගත හා සුවිශේෂ ප්‍රතිපත්තිමය එළඹුමක් භාවිත කළ යුතු බව අවධාරණය කරනු ලැබේ. සාධාරණත්වය, ආර්ථිකය සහ පාරිසරික සමතුලිතබව සහිත තිරසර සංවර්ධනයක් සඳහා භෞතික සංවර්ධනයට සාපේක්ෂව මානව කේන්ද්‍රීය සංවර්ධන පර්යවලෝකයක් වෙත අවධානය යොමු කළ යුතු බව මෙහිදී පෙන්වා දෙනු ලැබේ.

**ප්‍රමුඛ පද:** ප්‍රධාන ප්‍රවාහයෙන් බැහැර කණ්ඩායම්, කතිකාව, අගය-ධර්මතා, සරල සමාජ, බහිෂ්කාරක සම්බන්ධතා, 2030 න්‍යාය පත්‍රය

ISSN 2756-925X ISSN 0236-2090
CC BY NC

**හැඳින්වීම**

පරිපාලනය හෝ කළමනාකරණය ස්ථිරසාර සංවර්ධනයෙහි ප්‍රධාන මෙහෙයුම් මූලධර්මයයි (Goosen, 2012). අසමානතාව අවම කරමින්, සාධාරණ සහ ප්‍රජාතන්ත්‍රවාදී සංවර්ධනයක් ස්ථාපනය කිරීම මගින් ලෝක ප්‍රජාවගේ සමාජ සුභසාධනය සහ ජීව ගුණය ඉහළ නැංවීම එහි අභිමතාර්ථයයි (Campbell, 2013; UN, 2015; Bhuyan, 2017). එහිදී සත්‍ය වශයෙන්ම පරිපාලනයක් අවශ්‍ය වන්නේ බහුවිධ හේතු පදනම් කොටගෙන පරිපාලනයකට භාජනය නොවන ප්‍රජා කළමනාකරණය කිරීම තුළින් ඔවුන්ගේ සුභසාධානය ස්ථාපනය කිරීම උදෙසාය (O’donnell *et al.*, 2014; Breslow *et al.*, 2017). පරිපාලනය හුදෙක් දේශපාලන ප්‍රපංචයක් පමණක් නොවන අතර එය සමාජ ක්‍රියාවලියකි. සමාජ ක්‍රමයක මූලික ව්‍යුහය ආරක්ෂා කර ගැනීම සඳහා පරිපාලනය මැදිහත් වෙයි. තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍යයේ මැදිහත්වීම විශේෂයෙන් අවධාරණය කොට තිබුණද, ප්‍රජාවගේ භූමිකාව සහ රාජ්‍ය නොවන අනෙකුත් ආයතනවල මැදිහත්වීමද විශේෂයෙන් අවධානයට ගෙන ඇත (UNRISD, 2017). රාජ්‍යය විසින් ස්වකීය සමාජ ක්‍රමයට යෝග්‍ය වන සමාජ ප්‍රතිපත්ති සකස් කරගත යුතු අතර එහිදී ‘‘සර්වසාධාරණත්වයේ මූලධර්මය’’ මූලික කොට ගත යුතුය (Kwon, 2017). බොහෝ රටවල දේශීය ප්‍රජාවගේ හෙවත් ආදිවාසී කණ්ඩායම්වලට සුවිශේෂී වූ අයිතිවාසිකම් ආරක්ෂා කර ගනිමින් ඔවුන්ගේ සමාජ සුභසාධනය සඳහා කිසියම් වැඩ පිළිවෙළක් සකස් කිරීම කෙරෙහි දියුණු වෙමින් පවතින රටවල මෙන්ම ඇතැම් සංවර්ධිත රටවලද අවධානය යොමු වී ඇත (Yu, 2018). ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවක් වන වැදි ප්‍රජාවගේ සමාජ සුභසාධනය සම්බන්ධයෙන්ද යම් අවධානයක් යොමු වී තිබුණත්, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිදී ඇතැම් ගැටලු ඉස්මතු වී තිබේ. එ බැවින්, මෙම අධ්‍යයනයෙහිදී රාජ්‍යයේ මැදිහත්වීම සහ සමාජ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිදී ආදිවාසී ප්‍රජාව මුහුණ දෙන ගැටලු සම්බන්ධයෙන් අවධානය යොමු කරනු ලැබේ.

සංවර්ධනය හෝ යම්කිසි සමාජ ක්‍රමයක් තුළ සමාජ, ආර්ථික සහ දේශපාලනික වශයෙන් ප්‍රගතියක් ඇති කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සම්බන්ධයෙන්, රාජ්‍ය මූලික විය යුතු යැයි පිළිගනු ලැබේ (Escobar, 2005; Pawar, 2014). සංවර්ධනය සඳහා රාජ්‍ය මැදිහත් විය යුතු යැයි පිළිගනු ලැබුවත්, එය කෙසේ විය යුතුද යන්න පිළිබඳ නිශ්චිත ක්‍රමයක් නොමැති බැවින් ඒ ඒ රාජ්‍ය විසින් ඔවුන්ට සුවිශේෂ වූ ක්‍රම භාවිත කරනු ලබන ආකාරයක් දක්නට ලැබේ (Desai and Potter, 2011). මේ සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින්ද යම් යම් ප්‍රතිපාදන ඉදිරිපත් කොට ඇත (UNDP, 2017; UNRISD, 2017). එහිදී ගෝලීය වශයෙන් පොදු ප්‍රතිපත්තියක් භාවිත කිරීමට වඩා, ප්‍රාදේශීය වශයෙන් සුවිශේෂී සහ යෝග්‍ය වන මූලධර්ම මාලාවක් භාවිත කිරීම අවධාරණය කොට ඇත. එයට හේතුව, සන්දර්භීය සුවිශේෂීතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වන බැවින්ය (Tom, Sumida Huaman and McCarty, 2019).

ISSN 2756-925X ISSN 0236-2090

ගෝලීය වශයෙන් පිළිගත් සංවර්ධන මූලධර්ම, දේශීය වශයෙන් වෙනස් කර ගැනීමට ඉඩ ලබාදී තිබෙන්නේ ප්‍රාදේශීය සුවිශේෂී තත්ත්ව කෙරෙහි අවධානය යොමු කළ යුතු බැවින්ය (Mansuri, Rao and Bank, 2013; Tom, Sumida Huaman and McCarty, 2019). විශේෂයෙන්ම, දේශීය ප්‍රජාව හෝ ආන්තීකරණයට ලක් වූ ප්‍රජාවගේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා දේශීයකරණය කරන ලද ප්‍රතිපත්ති භාවිත කිරීම වැදගත් වේ. ඔවුන්ගේ සමාජ ආස්ථානය සහ සමාජ ක්‍රියාකාරීත්වය, ගෝලීය තත්ත්ව සමග සමපාත කිරීම අපහසු වන බැවින්ය. නිදසුන් වශයෙන් ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාවගේ චර්යා රටාව, නවසීලන්තයේ මාවෝරිවරුන්ට වඩා වෙනස් වන ආකාරය පෙන්වා දිය හැකිය. මාවෝරිවරුන්ගේ වෛද්‍ය ක්‍රමය ශීත දේශගුණික තත්ත්වලට අනුකූලව ගොඩ නගා ගෙන ඇති අතර (McCreanor and Nairn, 2002; Penney, Barnes and Mccreanor, 2011)වැදි සමාජයේ වෛද්‍ය ක්‍රම තුළ වියළි කලාපීය ප්‍රදේශයකට සුවිශේෂී වන වෙදකම්වලින් සමන්විත වේ. මේ නිසා සෞඛ්‍ය සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිදී, ශ්‍රී ලංකාවේ වැදි සමාජයට යෝග්‍ය වන ප්‍රතිපත්ති මාවෝරි සමාජයටද ගැළපෙන්නේ යැයි කිව නොහැකිය. එබැවින්, සමෘද්ධිමත් සමාජයක් සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය කිරීම සහ සංවර්ධනයේ දේශීය ගමන් මාර්ගය හඳුනාගෙන, යෝග්‍ය සහ තිරසර තීරණය කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන වගකීමක් රාජ්‍යයට පැවරී තිබේ (Christenson and Robinson, 1989; Chambers, 1997).

එසේ වුවත්, සංවර්ධන පරිපාලනයේ ප්‍රධාන ලක්ෂණයක් වූයේ, සත්‍ය වශයෙන් පරිපාලනයක් අවශ්‍ය නොවන ප්‍රජාවන් කළමනාකරණ සන්දර්භයක් වෙත යොමු කරවීමය (Nandy, 1989; Escobar, 2005; Shiva, 2005). සමාජ පාලනය සම්බන්ධ කිසියම් ක්‍රමවේදයක් ඒ ඒ සමාජවල පවතින ආකාරය දැකිය හැකිය (Fortes and Pritchard, 1940; Brown, 1952). නූතන රාජ්‍ය පරිපාලනය එහි සංවර්ධිත හා විධිමත් අවස්ථාවකි. විධිමත් පරිපාලන ව්‍යුහයක් තුළට ප්‍රජාව අනුගත කරවීම මගින්, පාර්සන්ස් (1971) සහ ගිඩින්ස් (1984) තර්ක කරන්නේ නිශ්චිත පරමාර්ථයක් වෙතට වඩා පහසුවෙන් ගමන් කළ හැකි බවය. මේ නිසා විසි වන සියවසේ මධ්‍ය භාගයෙන් පසුව, ආර්ථික සහ සමාජ සුභසාධනය ඇති කර ගැනීම සඳහා ප්‍රජාව කළමනාකරණය කිරීමේ අරමුණ ඇතිව රාජ්‍යය යම්කිසි මැදිහත්වීමක් සිදු කරනු ලබන ආකාරය දැකගත හැකි වේ. එහිදී රාජ්‍ය විසින් කිසියම් ප්‍රතිපත්තියක් ඉදිරිපත් කරනු ලබන, ඒ අනුව ක්‍රියා කිරීමට නිලධාරී පැළැන්තියක් සිටින අතර ප්‍රජාවගේ වගකීමක් වශයෙන්ද අර්ථ දක්වනු ලැබේ. 2012 වර්ෂයෙහිදී ඉදිරිපත් කළ තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තීන් සකස් කිරීමද එක් එක් රාජ්‍යයේ වගකීමක් වන අතර, ප්‍රතිපත්ති දේශීයකරණය කර ගැනීම ද විශේෂයෙන් අවධාරණය කොට තිබේ (UN, 2017).

පාරිසරික ප්‍රතිපත්ති මගින් දේශීය පාරිසරික සම්පත් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති පිළියෙළ කිරීමෙහිදී පරිපාලන ක්‍රියාදාමයේ මූලික අවධානයක් යොමු වූයේ පාරිසරික හානිය

ISSN 2756-925X ISSN 0236-2090

සම්බන්ධයෙන් අවම මැදිහත්වීමක් සහිත දේශීය ප්‍රජාවන් වෙතය (Tsosie, 2009; Sengupta, 2015). පාරිසරික ආරක්ෂණය සම්බන්ධයෙන් නීති රෙගුලාසි සකස් කිරීමෙහිදී වැඩි පීඩනයක් එල්ල වූයේ පරිසරය සමග ජීවත් වන එහෙත් සැලකිය යුතු පාරිසරික හානියකට සම්බන්ධ නොවන ප්‍රජාවටය (Heinämäki, 2010). වැදි සමාජය එවැනි සමාජ ක්‍රමයකි. එ බැවින් ස්ථිරසාර සංවර්ධනයෙහි මූලික අපේක්ෂා ළඟා කර ගැනීමෙහිදී සංවර්ධනය වෙමින් පවතින සමාජ ක්‍රමවල පවතින ව්‍යුහගත ස්ථාවර හේතුවෙන් බොහෝ දුරට සංකීර්ණ ගැටලු ඉස්මතුවීමට ඉඩ තිබේ. විශේෂයෙන් ම ඒකීය සමාජ සන්දර්භයක් තුළ බහුවිධ කණ්ඩායම් පවතින බැවින්, සාධාරණත්වය සහ සමාන්තමතාව සහිත සමාජ සංවර්ධනයක් ස්ථාපනය කොට පවත්වාගෙන යාම ප්‍රබල අභියෝගයක් බවට පරිවර්තනය වෙයි (Chambers, 1983).

තිරසර සංවර්ධන අභිමතාර්ථ පදනම් වී තිබෙන්නේ, සාධාරණත්වය සහ සමානාත්මතාව නමැති මූලධර්ම මතය. මේ නිසා සංවර්ධනය සාධාරණ සහ සමානාත්මතා පදනමකින් ස්ථාපනය විය යුතුය. සංවර්ධනය කිසියම් ක්‍රියාවලියක්ද වන බැවින්, සමාජගත එක් පිරිසක් පීඩාවට පත් වන ආකාරයෙන් සහ වෙනත් පිරිසකට සුභසිද්ධිය ලැබෙන ආකාරයෙන් කටයුතු කිරීම සාධාරණත්ව හා සමානාත්මතා මූලධර්ම උල්ලංඝනය කිරීමකි (Midgley, 2014; Midgley and Pawar, 2017). එය සත්‍ය සුබසාධනයක් වශයෙන් අර්ථකථනය කළ නොහැකි වන්නේ, තිරසාරභාවයට එයින් හානියක් විය හැකි බැවින්ය (Jeremy, 1993).

එබැවින්, මෙම අධ්‍යයනයෙහි දී මූලික වශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ තිරසර සංවර්ධන අභිමතාර්ථ පාදක කොටගත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිදී ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම සම්බන්ධයෙනි. ආදිවාසී හෝ ශ්‍රී ලංකාවේ වැදි සමාජය, ප්‍රධාන සමාජ ප්‍රවාහයට වඩා වෙනස් ලක්ෂණ නිරූපණය කරන සමාජ කණ්ඩායමකි (De Silva and Punchihewa, 2011). මොවුන් දීර්ඝ කාලයක් පුරා වනාන්තර ආශ්‍රය කොට ගෙන ජීවත් වූ සරල නිෂ්පාදන ක්‍රමයක් සහිත ප්‍රජාවක් වශයෙන් පිළිගනු ලැබේ(Seligman, 1911). එනමුත්, පසුගිය කාල වකවානුව තුළ රාජ්‍ය විසින් ඉදිරිපත් කළ සංවර්ධන ප්‍රතිපත්ති හේතුවෙන් වැදි සමාජය යම් යම් අපහසුතාවලට මුහුණ දුන් බව පෙනේ. මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වැදි සමාජ කණ්ඩායම් නැවත පදිංචි කිරීමත්, ඔවුන් කෘෂිකර්මාන්තයට හුරු කිරීමත් වැනි ප්‍රතිපත්ති වැදි සමාජයේ සමාජ-සංවර්ධනයට බලපෑම් එල්ල කළ බවක් පෙනේ. මේ නිසා මෙම අධ්‍යයනයෙහිදී රාජ්‍ය මගින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ප්‍රතිපත්ති, සුවිශේෂී සමාජ කණ්ඩායම්වල සමාජ සංවර්ධනයෙහිදී අභියෝග ඉස්මතු කිරීමට හේතුවක් වන ආකාරය පෙන්වා දෙනු ලැබේ.

සංවර්ධනය වෙමින් පවතින හෝ තුන්වන ලෝකය යැයි නිර්වචනය කරනු ලබන සමාජවල ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථ ළඟා කර ගැනීම සඳහා, සමාජ සංවර්ධනය සහ සරල සමාජ ප්‍රජාවගේ යහපැවැත්ම අතර පවතින සම්බන්ධතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය (Yu, 2018). සමාජ සංවර්ධන පරමාර්ථවල ප්‍රධාන අපේක්ෂාව වන්නේ සමාජගත පුද්ගලයන්ගේ ජීව ගුණය (Well Being) ඉහළ නැංවීමය. එහිදී බාහිර මැදිහත්වීමක් සහිතව සමාජ ප්‍රතිපත්ති ස්ථාපනය කිරීම මගින් සමාජ ව්‍යුහය තුළ ස්වභාවික වශයෙන් ක්‍රියාත්මක වන ධර්මතා සහ ප්‍රජාවගේ චර්යාව

ISSN 2756-925X ISSN 0236-2090
cc BY NC

කෙරෙහි යම් බලපෑමක් සිදු විය හැකිය (Chambers, 1997). මේ නිසා භූතානය වැනි රටවල් ඇතැම් බටහිර නිෂ්පාදිත සංවර්ධන ආකෘති භාවිතයට ගන්නා බවක්ද නොපෙනේ. ඔවුන් සංවර්ධනය මැනීම කිරීම සඳහා වෙනත් ආකෘතිද භාවිත කරයි (Brooks, 2013). සංවර්ධන ක්‍රියාවලියෙහිදී වෙනත් පාර්ශ්වයක් විසින් මැදිහත්වීම මූලික ලක්ෂණයක් වුවත්, අදාළ ප්‍රජාවගේ වගකීම හා මැදිහත්බව පිළිගැනීම විශේෂයෙන් අවශ්‍ය වේ (Chambers, 1983; Pawar, 2014; Midgley and Pawar, 2017).

සමාජ විකාශනය ස්වභාවිකව සිදු වූවක් නොවේ. එය බොහෝ දුරට මානව මැදිහත්වීමෙන් සිදුවන ක්‍රියාවලියකි (Ember and Ember, 2015). සමාජයෙහි විකාශනය ධනාත්මක වශයෙන් සංවර්ධනය වෙත ඉලක්කගත වී තිබීම පුද්ගලාර්ථසාධනය කෙරෙහි විශේෂයෙන් හේතු වන බව පිළිගනු ලැබේ. ස්වභාවික සමාජ විකාශනයෙහි දිශානති පැහැදිලිව පුරෝකථනය කළ නොහැකි බැවින් සමාජගත පුද්ගලයන්ගේ මැදිහත්වීමක් සහිතව සමාජ ක්‍රමයන් සංවර්ධනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු වේ. එමගින් සැලකිය යුතු පුරෝකථනයක් ඉදිරිපත් කිරීමට හැකි වනු ඇතැයි පිළිගනු ලැබේ (Desai and Potter, 2011). ගතික ප්‍රපංචයක් වශයෙන් යම්කිසි සමාජ සංස්ථාවක් සංවර්ධිත මට්ටමකට පත් කිරීමේ ක්‍රියාවලිය නවීන විද්‍යාත්මක ක්‍රියාවලි මගින් විධිමත් කොට තිබේ. එබැවින් සංවර්ධනයෙහි අවසාන පරමාර්ථය වන්නේ භෞතික වශයෙන් මෙන්ම සමාජීය වශයෙන්ද සමාජ ක්‍රමවල ස්ථාවරත්වයක් ස්ථාපනය කිරීමය. ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථ නිර්දේශ කිරීමෙහිදී වුවත් ආර්ථික, පාරිසරික සහ සමාජ සමානාත්මතාව සහිත ඒකාබද්ධ සංවර්ධන ප්‍රවේශයක් ඉදිරිපත් කිරීමෙන් සමාජ ක්‍රමවල සමතුලිත සංවර්ධනයක් අපේක්ෂා කොට තිබේ (UN, 2015).

භෞතික සංවර්ධනය පැහැදිලි ප්‍රමුඛතාවක් ගනු ලැබුවත්, සමාජ සහ පාරිසරික සංවර්ධනය සමගාමී වශයෙන් ප්‍රධාන ප්‍රවාහයට සම්බන්ධ නො වන්නේ නම් බොහෝ දුරට සංවර්ධනයෙහි ස්ථිරසාර භාවය පිළිබඳ ගැටලු උද්ගත වේ (CFSD, 2017; Midgley and Pawar, 2017). ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථ ළඟා කර ගැනීම ප්‍රමුඛ කොටගත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහිදී සමාජ ප්‍රතිපත්ති සම්පාදනය වඩාත් බුද්ධිමත් සහ දේශීය අගය කේන්ද්‍ර කොටගත් පිළිවෙළක් මත පදනම් විය යුත්තේ එබැවින්ය. මානව සුභසාධනය සහ යහ පැවැත්ම ස්ථාපනය කිරීමෙහි දී හුදෙක් වියුක්ත සමාජ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම යෝග්‍ය නොවේ. පුද්ගලයන්ගේ සමාජ හා ආර්ථික ක්‍රියාකාරීත්වය ස්වභාවික පාරිසරික උපනති මත වෙසෙසින් රඳා පවතින බැවින් ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් සියලු විචල්‍යයන් සමාන විනිශ්චයකින් පිළිගත යුතුය (Desai and Potter, 2011). ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථ නිර්දේශ කිරීම සඳහා, පූර්ව සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ ආශ්‍රිත අත්දැකීම් සහ අභියෝග පාදක වූ බැවින් සාවද්‍යතා අවම කර ගැනීමට හැකි වනු ඇතැයි විශ්වාස කරනු ලැබේ. එසේ වුවත්, සංවර්ධනය වෙමින් පවතින සමාජවල නෛසර්ගික වශයෙන් පවතින ස්තරායන සාධක සහ වෙනත් සමාජ විභේදන විසින් සමාජ ප්‍රතිපත්ති පිළියෙළ කිරීමෙහිදී අනපේක්ෂිත අභියෝගයන් ඉස්මතු කිරීමෙහි අවකාශයක් පවතියි (Esping-Andersen, 2015).

ISSN 2756-925X ISSN 0236-2090
BY NC

ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථ පිළියෙළ කිරීම සඳහා විවිධ සංස්කෘතික කලාප නියෝජනය කරන විද්වතුන් සම්බන්ධ වුවත්, සංවර්ධනය වෙමින් පවතින ලෝකයෙහි පවතින අනන්‍ය සමාජ සංස්ථා සහ ව්‍යුහ කෙරෙහි ප්‍රමුඛ අවධානයක් යොමු කොට නොමැති බව පෙනේ (Deacon, 2016; Koehler, 2016; Belda-Miquel, Boni and Calabuig, 2019). එබැවින් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින සමාජ ආශ්‍රිතව සමාජ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමෙහිදී හුදෙක් විද්වත් කතිකා මගින් නිර්දිෂ්ට කරන ලද ප්‍රතිපත්ති ව්‍යුහ ඒ ආකාරයෙන් ම භාවිත කිරීම ගැටලුකාරී විය හැකිය. එ වැනි තත්ත්ව ගල්ඔය සංවර්ධන ව්‍යාපෘතිය ආශ්‍රිතව දක්නට ලැබිණ (Uphoff, 1992). දියුණු වෙමින් පවතින රටවල ස්ථාපනය කරනු ලබන කවරාකාර වූ හෝ ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළක් ප්‍රිස්මයක් තුළින් ගමන් ගත් ආලෝක ධාරාවක් මෙන් විවිධ අනපේක්ෂිත ප්‍රතිඵල ඇති කිරීමට හේතු වන්නේ යැයි Fred Rigs තර්ක කරයි(Shamsul Haque, 2010). සාධාරණත්වය පදනම් කොටගත් මානව සුභසාධනයක් සහ පාරිසරික වශයෙන් සමස්ත ජෛවීය අවශ්‍යතා තෘප්ත කරන සංවර්ධනයක් සඳහා රාජ්‍ය විසින් ක්‍රමවත් සමාජ ප්‍රතිපත්තිමය මැදිහත්වීමක් සිදු කළ යුතු වන්නේ එබැවින්ය.

සමාජ සංවර්ධනය යනුවෙන් අර්ථකථනය කරනු ලබන්නේ පුද්ගලයන්ගේ ජීව ගුණය පවතින තත්ත්වයට වඩා යහපත් යැයි අපේක්ෂිත තත්ත්වයකට පත් කිරීමේ ක්‍රියාවලියකි (Midgley and Pawar, 2017). සමාජයක් සතු සම්පත් වඩාත් සාධාරණ වශයෙන් බෙදී යාමක් එහිදී අපේක්ෂා කරනු ලැබේ. ''සමාජ සංවර්ධනයෙහි ප්‍රධාන දර්ශකයක් වන්නේ ප්‍රධාන ප්‍රවාහයෙන් බැහැර කරන ලද පුද්ගල කණ්ඩායම්වල සහ ප්‍රජාවන්හි සුබසාධනය කෙරෙහි වැඩි අවස්ථාවන් ලබා දීමය'' (Jones and Pandey, 1981, p. 33). ස්තරීකරණයට භාජනය වූ සංකීර්ණ සමාජ ක්‍රමයක් තුළ ආර්ථික, පාරිසරික සහ සමාජ යන ප්‍රධාන අංශ අතර තුලනාත්මක සංවර්ධනයක් ස්ථාපනය කිරීම පහසු කාර්යයක් නොවන බැවින් ඒ සඳහා රාජ්‍ය විසින් කිසියම් ප්‍රතිපත්තිමය මැදිහත්වීමක් සිදු කළ යුතු යැයි අපේක්ෂා කරනු ලැබේ (UNRISD, 2017). විශේෂයෙන්ම තුන්වන ලෝකය යැයි ලේබල්කරණය කරන ලද සමාජවල සංවර්ධන ප්‍රතිපත්ති සත්‍ය ක්‍රියාකාරීත්වයෙහිදී විකෘත වූ, අසමානතාව වර්ධනය කරන සහ සමතුලිතභාවය බිඳ දැමිය හැකි කාර්යයක් බවට පරිවර්තනය වීමේ අවකාශය දේශපාලනික වශයෙන්ම සංස්ථාගත වී තිබීමද ප්‍රධාන ගැටලුවක් වශයෙන් අයෙක් පෙන්වා දෙති (Myrdal, 1957).

සමාජ සංවර්ධනය, පාරිසරික ආරක්ෂණය සහ ප්‍රතිපත්ති සම්පාදනය අතර පැහැදිලි සම්බන්ධතාවක් පවත්වා ගෙන යාම සඳහා පරිපාලනමය මැදිහත්වීමක් අවශ්‍යය. බහුවිධ ආකෘති සහිත සංවර්ධන වැඩසටහන් භාවිත කිරීම මගින් ප්‍රජා අපේක්ෂා සහ අනන්‍යතාවලට අනුකූල සුබසාධනයක් ස්ථාපනය කළ හැකි බව බොහෝ දුරට පිළිගනු ලැබේ. මෑත කාලීන අන්තර්ජාතික කතිකා විසින් නිර්දේශ කරනු ලබන ආකාරයට පුද්ගලයන්ගේ සුබසාධනය සඳහා සර්වවිශ්වීය සාධාරණත්ව ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුය. ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථයන් වුවත් නිර්දේශ කොට තිබෙන්නේ උක්ත මූලධර්මයට අනුවය ("Transforming our world: the 2030 Agenda for Sustainable Development: Sustainable Development Knowledge Platform", 2016). එසේ වුවත් එකී


ISSN 2756-925X ISSN 0236-2090

අභිමතාර්ථ ළඟා කර ගැනීම සම්බන්ධ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සියලු සාවද්‍යතාවලින් බැහැරව ක්‍රියාත්මක වන්නේ යැයි අපේක්ෂා කළ නොහැකිය.

ක්‍රියාත්මක අවස්ථාවෙහිදී සමාජ ප්‍රතිපත්ති පදනම් කොටගෙන ඇතැම් සමාජ කණ්ඩායම් අසමමිතික වශයෙන් අසාධාරණ තත්ත්වයකට පත් නොවීම ප්‍රධාන මූලධර්මයක් වශයෙන් පිළිගනු ලැබේ (Agyeman, 2004). පුද්ගල සුභසාධනය සඳහා සාධාරණත්වය, සමානාත්මතාව, පාරිසරික සුරක්ෂිතතාව සහ පරිපාලනය ප්‍රමුඛ කොටගත් ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කිරීම අවශ්‍ය වන්නේ එබැවින්ය. පාරිසරික ප්‍රතිපත්තිය රාජ්‍ය පරිපාලන ප්‍රතිපත්ති මගින් විධිමත් කළ යුතු වුවත් එහිදී කළමනාකරණ ප්‍රවේශයකට වඩා මානව හිතවාදී එළඹුමක් වෙත අවධානය යොමු කිරීම අත්‍යවශ්‍යය (Shiva, 1991, 2005). සමාජ සංවර්ධනය සහ පුද්ගල අභිමතාර්ථ අතර ඒකමිතියක් පවත්වාගෙන යාම ප්‍රධාන අභියෝගයක් වන බැවින් ප්‍රජාව හා අනුගත වූ ප්‍රතිපත්තිමය එළඹුමක් භාවිත කිරීම යෝග්‍ය විසඳුමක් විය හැකි යැයි අයෙක් තර්ක කරත් (Agyman, 2004).

ඉන්දියාවේ නර්මදා ගංගාව ආශ්‍රය කොටගෙන ඉදි කිරීමට සැලසුම් කරන ලද මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් උතුරු ඉන්දියාවේ කාර්මීකරණය වේගවත් කරමින් පුද්ගල සුභසාධනය ඉහළ නැංවීමට හැකියාවක් පැවතියත්, ගෝත්‍රික සහ සරල සමාජගත ප්‍රජාවගේ සුභසාධනය ප්‍රධාන ප්‍රවාහයේ කතිකාවලින් බැහැර කොට තිබීම ස්ථිරසාර සුභසාධනයක් සඳහා හේතු නොවේ (Shiva, 2005). ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථවල දී කිසිදු ප්‍රජාවක් විශේෂ වශයෙන් වෙන් කොට සැලකීම යෝග්‍ය ප්‍රතිපත්තියක් වශයෙන් අවධාරණය කරනු නොලැබේ. එබැවින් මානව සුභසාධනය පදනම් කොටගත් පරිපාලනමය මැදිහත්වීම්වලදී සමානාත්මතා මූලධර්මය කෙරෙහි විශේෂ ස්ථානයක් හිමි විය යුතුය. ඕස්ට්‍රේලියාවේ මරේ ඩාර්ලිං ගංගාව ආශ්‍රය කොටගෙන ඉදි කිරීමට නියමිතව පැවති මහා පරිමාණ සංවර්ධන යෝජනා ක්‍රමයක් සාමාන්‍ය ප්‍රජාවගේ විරෝධතා හේතුවෙන් නවත්වාලීමට සිදු විය (Gross, 2010). සාමාන්‍ය ප්‍රජාවගේ මතවාද පරිපාලනමය මැදිහත්වීම්වලදී සලකා බැලීම අදාළ අංශ අතර සමතුලිතභාවයක් වර්ධනය කිරීමට හේතු වේ. ප්‍රජාව සහ පරිපාලනමය අංශ අතර පවතින අසමමිතිය ස්ථිරසාර සුභසාධනයක් සඳහා බාධා ඇති කරනු ලබයි. එබැවින් සිවිල් සමාජ නැගී සිටීම් හෝ සමාජ ව්‍යාපාර යනාදිය හුදෙක් අරගලකාරී අවස්ථා වශයෙන් පමණක් අර්ථකථනය කිරීම සාවද්‍යය. සමාජ ප්‍රතිපත්ති සම්පාදනයෙහිදී සිවිල් සමාජ මතවාදයන් විශේෂයෙන් අවධානයට ගැනීම අවශ්‍ය වන්නේ මේ හේතුවෙනි (Gross, 2010).

සමතුලිත සමාජ සංවර්ධන කාර්යයෙහිදී දේශීය ප්‍රජාව සාම්ප්‍රදායික වශයෙන් ම පරිසර හිතකාමී ආර්ථිකයක් වෙත සම්බන්ධ වෙමින් ස්ථිරසාර ජීවන පැවැත්මක් සඳහා අනුගත වී සිටීම ස්වභාවිකය (Richardson, 2011). ස්වභාවික පාලනයක් සහ පැවැත්මක් සහිත සමාජ ක්‍රමවල සංවර්ධනය විධිමත් කිරීමෙහිදී රාජ්‍ය පරිපාලකයන් ස්වභාවික ධර්මතාවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ. නිශ්චිත සමාජ ක්‍රමයක් නියෝජනය කරන ප්‍රජාවගේ අවශ්‍යතා සහ අනන්‍යතා ස්වභාවික පාලන ධර්මතා සමග විශේෂයෙන් සම්බන්ධ වී පවතියි. එබැවින්, බාහිර මැදිහත්වීමක් සහිත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිදී ස්වභාවිකත්වය සහ කෘත්‍රිම ක්‍රියාකාරීත්වය අතර

ISSN 2756-925X ISSN 0236-2090

අසමමිතික තත්ත්ව ඉස්මතු විය හැකිය. Richardson (2011) අවධාරණය කරන ආකාරයට පාරිසරික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ඍජුවම බලපෑමට භාජනය වන ප්‍රජාව හුදෙක් ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ දෘෂ්ටි කෝණවලට අනුගත වන අජීවී වස්තුවක් වශයෙන් පිළිගැනීම අභිනතියක් සහිත විනිශ්චයකි.

සමාජ සංවර්ධනය පදනම් කොටගෙන යම් යම් සමාජ කණ්ඩායම්වල සුභසාධනය සඳහා පරිපාලනමය වශයෙන් බාහිර මැදිහත්වීමක් සිදු කිරීම තුළ කිසියම් දේශපාලනයක්ද දක්නට ලැබේ (Sengupta, 2015). නූතනත්වය විසින් තාර්කිකරණය ව්‍යාප්ත කිරීම සහ සාධාරණත්වය ස්ථාපනය කිරීම සඳහා යම් දායකත්වයක් ලබාදී තිබේ. එසේ වුවත් ඒ හා සමගාමී වශයෙන් ස්වදේශීකත්වය (Indigeneity) තර්ජනයට භාජනය වෙයි (Dove, 2006). මේ නිසා ප්‍රතිපත්ති සම්පාදකයන් සහ අවසාන ප්‍රතිලාභීන් යන පාර්ශ්ව අතර පවතින බල සම්බන්ධතාවල අසමමිතිකත්වය හා අන්‍යොන්‍ය දුරස්ථ භාවය තීව්‍ර වෙයි. සිවිල් සමාජ නැගී සිටීම් එහි අවසාන ප්‍රතිඵලය වන අතර ප්‍රතිපත්ති අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ බහුවිධ අභියෝග සමුදායක්ද ඉස්මතු කරයි (Gibbon, 1997; Lindberg, 1997; Oommen, 1997; Schejtman, 1997).

ජේම්ස් බේ සහ උතුරු ක්වේබෙක් ව්‍යාපෘති මගින් මහා පරිමාණ සංවර්ධන ප්‍රයත්නයක් කෙරෙහි අවධානය යොමු කිරීම හේතුවෙන් ස්වදේශික ජන කණ්ඩායම්වල සමාජ ස්ථාවරත්වය කෙරෙහි බාධා ඇති වූ ආකාරය Evelyn Peters විසින් පෙන්වා දී තිබේ (1999). බොහෝ දුරට නිර්දේශ කරනු ලබන ප්‍රතිපත්තිවල නෛසර්ගික වශයෙන්ම පවතින විසමතා සහ සාවද්‍යතා ස්වදේශීය ප්‍රජාවගේ අපේක්ෂා සහ ප්‍රතිපත්තිමය අවශ්‍යතා අතර ගැටීමක් ඇති කිරීමට හේතු වන බව ඔහු තර්ක කරයි. එපමණක්ද නොව, ඇතැම් ප්‍රතිපත්ති ව්‍යවහාරික වශයෙන් නිශ්චිත සමාජ ක්‍රම ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමද අපහසු කාර්යයක් වන බැවින් අනපේක්ෂිත ප්‍රතිඵල ඉස්මතු වෙයි. ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථ යථාර්ථයක් බවට පත් කිරීම සඳහා සංස්කෘතිකමය වශයෙන් සුවිශේෂ වූ සමාජ සන්දර්භයන්ගේ ස්වභාවය පිළිබඳ පැහැදිලි දෘෂ්ටි කෝණයක් අවශ්‍ය වන්නේ එබැවින්ය.

පාරිසරික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිදී දේශීය ප්‍රජාව හෝ ආදිවාසී ප්‍රජාව බොහෝ අභියෝගවලට මුහුණ දෙන ආකාරය පූර්ව අධ්‍යයන මගින් පෙන්වාදී තිබේ(Jenson and Papillon, 2000; Cornell and Jorgensen, 2019; Wang and Wang, 2019). ආදිවාසීන්ගේ සංස්කෘතික අනන්‍යතාව සම්බන්ධ ගැටලු ඉස්මතු වීම එහිදී ප්‍රධාන වේ. ප්‍රධාන සමාජ ප්‍රවාහයට වඩා සුවිශේෂී වූ සංස්කෘතික ලක්ෂණ පෙන්නුම් කරන ආදිවාසී සමාජ කණ්ඩායම්, ප්‍රධාන ප්‍රවාහයේ සමාජ ක්‍රමයක් වෙතට ඇතුළත් කර ගැනීම ගැටලු සහගත ය (Absolon, 2016). ස්වකීය අනන්‍යතාව සහ සංස්කෘතික අත්දැකීම්, පෞරුෂය සකස් වීමටද බලපෑම් කරන බැවින් (Rogoff *et al.*, 2003), සංවර්ධන ප්‍රතිපත්ති මගින් ආදිවාසී සංස්කෘතික අනන්‍යතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු යැයි පිළිගනු ලැබේ. එසේ වුවත්, බොහෝ අවස්ථාවලදී ආදිවාසී කණ්ඩායම් ප්‍රධාන ප්‍රවාහයෙන් බැහැර වන අතර ඔවුන් සංවර්ධනයේ පීඩිතයන් බවට පත් වේ (Gross, 2010). මෙම තත්ත්වය තිරසර සංවර්ධනයකට බාධා ඇති කරයි.

ISSN 2756-925X ISSN 0236-2090

සංවර්ධනය වෙමින් පවතින සමාජ ක්‍රමයක් වශයෙන් ශ්‍රී ලංකාව, ස්තරායන සාධක සහ බහුවිධ අනන්‍යතා සහිත ප්‍රජා සමූහයක් නියෝජනය කරයි. එබැවින් සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොටගත් ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථ ප්‍රතිපත්තිමය වශයෙන් ක්‍රියාත්මක කිරීම පහසු කාර්යයක් නොවේ. 2015 වර්ෂය අවසාන වන විට සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ ළඟා කර ගැනීම සඳහා ලොව බොහෝ රාජ්‍ය ස්වකීය දේශපාලනික කතිකා, සංවර්ධනය නමැති සංකල්පය වෙත යොමු කොට තිබිණ. එහි කිසියම් ප්‍රතිඵලදායක බවක් පැවතියත්, 2015 වර්ෂයෙන් පසුව 2030 න්‍යාය පත්‍රය අනුව ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථ ළඟා කර ගැනීම සඳහා බොහෝ ජාතික රාජ්‍ය උත්සාහ කරන බව පෙනේ. එසේ වුවත්, 2015 න් පසු කාලය තුළ අදාළ සමාජ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සිදු වන්නේ සියලු ආකාරයෙන් නවීන වූ සමාජ ක්‍රමයක් තුළ නොවේ.

මෙතෙක් පැවති ධර්මතා සහ පසුගිය ප්‍රතිපත්ති මගින් යම් කළමනාකරණයකට භාජනය කරන ලද පෙර පැවති සමාජ ක්‍රම ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා නිර්දිෂ්ට ප්‍රතිපත්තීන් මගින් නැවතත් පරිපාලනයකට භාජනය කළ යුතුව තිබේ. මෙය නිසගයෙන්ම පහසු කාර්යයක් නොවේ. බහුවිධ සමාජ කණ්ඩායම් සහිත ශ්‍රී ලංකා සමාජය තුළ සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා කිසියම් වැඩ පිළිවෙළක් සම්පාදනය කරමින් පවතියි. ඒ සඳහා, පැවති සමාජ ක්‍රම ආශ්‍රිත අත්දැකීම් සහ අභියෝග සංස්ලේෂණය කිරීම අතිශය වැදගත්ය. විශේෂයෙන්ම සරල සමාජ කණ්ඩායමක් වශයෙන් ''වැදි ප්‍රජාව'' මුල් කාලීන මහවැලි සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිපත්තිවලට අනුව ''සංවර්ධනය'' නමැති කතිකාවට අනුගත කිරීම නිසා අනපේක්ෂිත ගැටලු සමුදායකට මුහුණ දෙමින් සිටියි (De Silva and Punchihewa, 2011). මහවැලි ව්‍යාපාරය මගින් මූලික වශයෙන් ඉස්මතු කරන ලද ප්‍රාදේශීය ගැටලු බොහෝමයක් පසුකාලීන ප්‍රතිපත්තිවල පැවති අයෝග්‍යතා හේතුවෙන් තව දුරටත් වර්ධනය වී තිබේ. ප්‍රජාවගේ සුභසාධනය සහ ජීව ගුණය ඉහළ නැංවීමත්, සාධාරණතාවක් සහ සමානාත්මතාවක් සහිත සමාජ ක්‍රමයක් ස්ථාපනය කිරීමත් සම්බන්ධ අභිමතාර්ථ එයින් අභියෝගයට භාජනය වේ. එබැවින් සමාජ ප්‍රතිපත්ති සම්පාදනය කරමින් ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කිරීමේ ක්‍රියාවලිය ශ්‍රී ලංකා සමාජය තුළ සරල හා සුගම කාර්යයක් විය නොහැකි බව පැහැදිලිය. පරිපාලන තන්ත්‍රය විසින් ක්‍රමානුකූල දැක්මක් සහිතව පූර්ව අත්දැකීම් විශේෂයෙන් සලකා බැලීම අවශ්‍ය බව මෙහිදී අවධාරණය කරනු ලබන්නේ එබැවින්ය.

**පර්යේෂණ ක්‍රමවේදය**

සමාජ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමෙහි දී පුද්ගලයාගේ අභිලාෂය සහ අර්ථකථන කෙරෙහි පැහැදිලි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ (Chambers, 1997; Pawar, 2014). ස්ථරගත සහ විෂමජාතීය සමාජ ක්‍රමයක් තුළ සාධාරණත්වය සහ සමානාත්මතාව වැනි නවීනත්ව මූලධර්මයන් පාදක කොටගෙන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ව්‍යාප්ත දත්තයන්ට සාපේක්ෂ වශයෙන් කේන්ද්‍රීය සහ අර්ථකථනාත්මක විග්‍රහයන් කෙරෙහි මූලිකත්වයක් හිමි විය යුතු ය (Moran, 2000). එ බැවින් මෙම අධ්‍යයනය සඳහා ප්‍රපංචවේදය කේන්ද්‍ර කොටගත් මානවවංශවිද්‍යාත්මක අධ්‍යයන ක්‍රමවේදය

භාවිත කරනු ලැබිණ (Honer and Hitzler, 2015). ජීවන අවකාශ විශ්ලේෂණ මානවවංශ ලේඛනය යනුවෙන්ද මෙම ක්‍රමවේදය හඳුන්වනු ලැබේ. එහිදී මානව වංශවිද්‍යාත්මක ක්‍රමවේදය මූලික වශයෙන් භාවිත කළත්, පුද්ගලයා විසින් දෛනික ජීවිතය අර්ථකථනය කරන ආකාරය කෙරෙහිද අවධානය යොමු කරනු ලැබේ (Reeves, Kuper and Hodges, 2008).

මෙම අධ්‍යයනය සඳහා දඹාන, පොල්ලෙබැද්ද, රතුගල, දානියගල සහ හේනානිගල නමැති වැදි ප්‍රජාව ජීවත් වන ප්‍රදේශ තෝරාගනු ලැබිණ. ස්වදේශික ප්‍රජාවගේ නායකත්වය හා දේශපාලනය, ස්වදේශික ප්‍රජාවගේ සාමාන්‍ය ජන ජීවිතය, නැවත පදිංචි කරන ලද ප්‍රජාවගේ දෛනික ජීවන රටාව වෙනස් වීම නමැති මූලික සංකල්පයන් වඩා පහසුවෙන් අධ්‍යයනය කිරීම අරමුණු කර ගෙන ඉහත සඳහන් ප්‍රදේශ තෝරාගනු ලැබිණ. ඍජු නිරීක්‍ෂණ ක්‍රමය භාවිතයෙන් වැදි ප්‍රජාවගේ වෙනස් වූ ජීවන චර්යාවල ස්වභාවය තේරුම් ගැනීමට උත්සාහ කරන ලද අතර, සම්මුඛ සාකච්ඡා ක්‍රමය ආශ්‍රයෙන්ද දත්ත සමුච්චය කරනු ලැබිණ. වැදි භාෂාවේ ඇතැම් යෙදුම් තේරුම් ගැනීම සහ පැහැදිලි කර ගැනීම සඳහා සිංහල භාෂාව සහ වැදි බස පිළිබඳ ප්‍රවීණත්වයක් සහිත ප්‍රදේශවාසී ශිෂ්‍යයන් දෙදෙනෙකු යොදා ගනු ලැබිණ. මේ අනුව, අර්ථකථන ඉදිරිපත් කිරීමෙහිදී සිංහල භාෂාවෙන් නිදසුන් ඉදිරිපත් කරනු ලැබිණ. තේමාකරණය උපයෝගී කොටගෙන දත්ත විශ්ලේෂණය කරන ලදි (Braun and Clarke, 2006; Lorelli S. Nowell, Jill M. Norris, Deborah E. White, 2017). විශ්ලේෂිත දත්ත සංස්ලේෂිත කථනයක් වශයෙන් ඉදිරිපත් කරනු ලැබේ. සමස්ත දත්ත තේමාකරණය මගින් විශ්ලේෂණය කරන ලද අතර එහිදී ඍජු නිරීක්‍ෂණවලින් ගම්‍ය වන අර්ථද ඒකාබද්ධ කරන ලදි. ඉන් පසුව වැදි සමාජය, සමාජ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳ සංස්ලේෂිත ආඛ්‍යානයක් (න්‍යායාත්මක කතන්දරයක් / Storyline) ගොඩ නගන ලදි (Birks and Mills, 2019). එම ආඛ්‍යානය තුළ විවිධ තේමා අන්තර්ගත වන අතර ඒවා පියවරෙන් පියවර නිදසුන් සහිතව ඉදිරිපත් කරනු ලැබිණ. ප්‍රාදේශීය සුවිශේෂී සංස්කෘතික තත්ත්ව තේරුම් ගැනීම සඳහා ඇතැම් අවස්ථාවලදී අර්ථකථන පැහැදිලි කිරීම සඳහා රූප සටහන්ද ඉදිරිපත් කොට ඇත. මෙම පර්යේෂණය සඳහා තෝරාගත් වැදි ජනාවාස සහිත සිතියමක් රූප සටහන 1 හි දක්වා ඇත.

ISSN 2756-925X ISSN 0236-2090

රූප සටහන 01: වැදි ජනාවාස ව්‍යාප්තිය




මූලාශ්‍රය:(Cultural Survival of Sri Lanka, 1994)

ISSN 2756-925X ISSN 0236-2090
BY NC

**විශ්ලේෂණය**

පූර්ණ සමාජ හා ආර්ථික සංවර්ධනයක් අභිමුඛ කරගනිමින් තිරසර සංවර්ධන අභිමතාර්ථ නිර්දේශ කරනු ලැබිණ. සංවර්ධනය වෙමින් පවතින ලෝකය සම්බන්ධයෙන් එහිදී විශේෂ අවධානයක් යොමු විය. භෞතික සංවර්ධනය වුවත් මානව සංවර්ධනය මත රඳා පවතින බැවින් ආර්ථික, සමාජ සහ පාරිසරික යන අංශ තුන තුලනය වන ආකාරයෙන් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම මෙහිදී අවධාරණය කරනු ලැබේ. ප්‍රතිපත්තිමය වශයෙන් සමාජ කළමනාකරණයක් සඳහා අවශ්‍ය වැඩසටහන් සම්පාදනය කිරීම රාජ්‍ය වෙත නිසගයෙන්ම හිමි වී තිබේ. එබැවින්, නව අභිමතාර්ථයන් සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමෙහිදී සමාජ තුළ පවතින විසමතා සහ ව්‍යුහීය සුවිශේෂීතා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

තිරසර සංවර්ධනය සාධාරණත්වය කේන්ද්‍ර කොටගෙන ක්‍රියාත්මක වන බැවින්, කිසිදු වෙන් කොට සැලකීමකින් තොරව සියලු පුද්ගලයන්ගේ ජීව ගුණය ඉහළ නැංවීම අරමුණු කර ගෙන ඇත. සම්පූර්ණ සහ සපලදායී වෘත්තීමය පසුබිමක් නිර්මාණය කිරීම මගින් ස්ථිරසාර ජීවන පැවැත්මක් තහවුරු කිරීම එහි අපේක්ෂාවකි. එමෙන්ම පාරිසරික හානිය අවම කිරීමත්, ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීමත් ස්ථිරසාර සංවර්ධන පරමාර්ථ මගින් අවධාරණය කරනු ලැබේ (Richardson, 2008). එනමුත්, මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිදී විවිධ ගැටලු ඇති විය හැකිය. සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ හා සමගාමීව දඹාන, පොල්ලේබැද්ද යනාදී ප්‍රදේශයන්හි පාරිසරික සංරක්ෂණය සඳහා ඉදිරිපත් කරන ලද පාරිසරික ප්‍රතිපත්ති මගින් සත්‍ය වශයෙන් ම සිදු වූයේ අදාළ ප්‍රජාවගේ තිරසාර පැවැත්ම කෙරෙහි බාධා ඇති වීමය. එ මගින් මෙතෙක් වනාන්තර සමග වැදි ප්‍රජාව අතර පැවති සම්බන්ධතාව බිඳ වැටුණු අතර, නිෂ්පාදන ක්‍රමයෙහිද වෙනසක් ඇති කරනු ලැබිණ. වැදි ප්‍රජාව වනාන්තර ආශ්‍රය කොට ගෙන ජීවත් වන සුළුතර දේශීය ජන කණ්ඩායමකි. මේ නිසා ජීවන පැවැත්ම සඳහා පරිසරයෙන් ලැබෙන දායකත්වය ඉහළ මට්ටමක පවතියි. එහෙත් පාරිසරික ප්‍රතිපත්ති හේතුවෙන් මේ වන විට ඔවුන්ට වනාන්තරවලට යොමු වීමේ නො හැකියාවක් පවතියි. මෙම තත්ත්වය ඔවුන්ට සුවිශේෂ වූ සංස්කෘතික අනන්‍යතාව බිඳ වැටීමට හේතුවක් වෙයි. එය සමාජ සංවර්ධනය කෙරෙහි බාධාවකි.

> ''අපි කැලේ හිටපු මිනිස්සු. මේ කැලෑවලින් තමයි අපි යැපෙන්නේ. කැලෑ අහිමි උනාම අපිට කරන්ඩ දෙයක් නෑ. වගා කරන්ඩ කියලා නිලධාරී මහත්තුරු අපිට කියනවා. ඒක තමයි දැන් කරන්නේ. ඒකට හුරු උනාට පස්සේ ඉස්සර අපිට තිබුණු සංස්කෘතික උත්සව ආදී කිසිවක් කර ගන්න බැරුව ගියා. අනෙක් අතට ගැනු වෙච්ච අපිට ගොවිතැන් කරන්ඩ අමාරුයි.'' (ස්ත්‍රී, රතුගල).

> ''හේනානිගලට ගෙනල්ල පදිංචි කළාට පස්සේ අපේකම නැති උණා කියල මං හිතන්නේ. මෙහෙට ආවට පස්සේ අපිට කිව්වා මාළු අල්ලන්ඩ කියලා. ඒක අපිට හුරු දෙයක් නොවෙයි. මේ නිසා කිහිප දෙනෙක් ම වැවේ ගිලිලා මැරුණා. කැලේට හුරු නිසා දඩයමක් කර ගන්න හොරෙන් හරි කැලේට යනවා. අපේ ළමයි

ISSN 2756-925X ISSN 0236-2090
CC BY NC

ඒ ජීවිතයෙන් ගොඩක් වෙන් වෙලා ඉන්නේ. ඒත් අපි කැමති අපේකම තියාගන්න. ඒ මොකද මේ රටේ මුල් පදිංචිකාරයෝ අපි'' (පුරුෂ, හේනානිගල)

ආදිවාසී ප්‍රජාව සහ පරිසරය අතර පැවති සම්බන්ධතාව අතිශය සංවේදී වූවක් බැවින් සන්දර්භීය සුවිශේෂීතා ආමන්ත්‍රණය නොකරන ප්‍රතිපත්ති මගින් අදාළ තත්ත්ව කළමනාකරණය කිරීම ගැටලු සහගත ය. ආදිවාසී ප්‍රජාවගේ අනන්‍යතාව සහ සංස්කෘතියට සමපාත වන නිෂ්පාදන ක්‍රමය වනාන්තර සහ දඩයම් ජීවිකාවක් මත රඳා පැවතීමත්, නූතන පාරිසරික ප්‍රතිපත්ති මගින් නවීනත්ව අගය හා සමපාත වන නිර්දේශ ක්‍රියාත්මක කිරීමත් හේතුවෙන් ආදිවාසී ප්‍රජාවගේ ජීවන සංතෘප්තිය හා සංවර්ධනය බිඳ වැටී තිබේ. ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථ ළඟා කර ගැනීම සඳහා සමාජ හා පාරිසරික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමෙහිදී උක්ත ගැටලුව නැවත උද්ගත වීමේ ප්‍රවණතාවක් පවතියි.

වැදි සමාජ ව්‍යුහය සකස් වීම කෙරෙහි ස්වාභාවික පරිසරය සහ ඒ සමග සම්බන්ධ වූ ආර්ථික ව්‍යුහය මූලික වී ඇත. දියුණු නිෂ්පාදන ක්‍රමයක් වැදි සමාජය තුළ දක්නට නොලැබුණද ජීවන පැවැත්ම තහවුරු කිරීම සඳහා සරල නිෂ්පාදන ක්‍රමයක් ඔවුන් විසින් අනුගමනය කරනු ලැබිණ. නිෂ්පාදන ක්‍රියාවලියක් යැයි අර්ථ දැක්විය නො හැකි වුවත්, දඩයම සහ පල වැල එකතු කිරීමේ ලක්ෂණ වැදි සමාජය තුළ දක්නට ලැබේ. මෙම මූලික ආර්ථික ක්‍රියාවලිය, සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් සැලකිය යුතු මට්ටමකින් වෙනස් වී ඇත. දඩයම හෝ පලවැල එකතු කිරීමද තව දුරටත් මේ සමාජවල දක්නට ලැබුණත්, කෘෂිකාර්මික කටයුතු සහ මිරිදිය ධීවර කර්මාන්තය කෙරෙහි වැදි සමාජය යොමු වී ඇත. එහි මූලික ප්‍රතිඵලයක් වූයේ පැවති සමාජ ව්‍යුහය සැලකිය යුතු මට්ටමකින් වෙනස් වීමය. ප්‍රධාන සමාජ ප්‍රවාහය තුළ ස්ථාපනය කරන ලද අධ්‍යාපන ක්‍රියාවලියට වැදි ප්‍රජාවද ඒකාබද්ධ කිරීමට උත්සාහ ගනු ලැබූ බැවින්, ඔවුන්ගේ අනන්‍යතාව සම්බන්ධයෙන් යම් ගැටලුවක් ඉස්මතු වී තිබේ. විශේෂයෙන් ම වැදි සමාජයට සුවිශේෂ වූ සංස්කෘතිකාංගයන් සම්බන්ධයෙන් නූතන අධ්‍යාපන ක්‍රමයෙන් ඔවුන්ට ලබාගත නොහැකි වන බැවින් සිංහල සමාජ සංස්කෘතික ලක්ෂණ විසරණය වීම් වශයෙන් යම් සංස්කෘතික සම්පර්කයක් ඇති වන බවක් පෙනේ. මේ හේතුවෙන් වැදි සමාජයේ සංස්කෘතිය, අනන්‍යතාව සහ පෞරුෂ ලක්ෂණ සිංහල සමාජය විසින් හෝ මුහුදු වැදි ප්‍රජාව අතර නම් දෙමළ සමාජය විසින් හෝ වෙනස්වීමකට භාජනය කරනු ලැබේ. අවසාන විග්‍රහයෙහිදී මෙහි ප්‍රතිඵලය වන්නේ වැදි සමාජයේ සුභසාධනයක් ඇති කිරීමකට වඩා ඔවුන්ට සුවිශේෂ වූ ජීවන චර්යාවෙන් බැහැරව වෙනත් ජීවන චර්යාවක් හුරු කරවීම ය.

''අපි කැමතියි අපේ ළමයිට අපේ ඉතිහාසය කියලා දෙන්ඩ. අපි විජය රජ්ජුරුවන්ට කලින් මේ රටේ හිටපු පැරණි කණ්ඩායමක්. මහියංගණේ වෙසක් උත්සවය තියනකොට අපි අපේ පැරණි බව විදහා දක්වනවා. මේ ගමෙත් පාසලක් තියෙනවා. කැම්පස් ගියපු ළමයිත් (දඹානේ ගුණවර්ධන) ඉන්නවා. එසේ වුවත්, ළමයිට අපේ සංස්කෘතියට වඩා වෙනත් සංස්කෘතියක් ඉගෙනීමට සිදු වෙලා තියෙනවා'' (පුරුෂ, හේනානිගල).

ISSN 2756-925X ISSN 0236-2090
cc BY NC

''අපි දැන් ගණිතය, සිංහල, ඉංග්‍රීසි වැනි විෂයන් ඉගෙන ගන්නවා. අපි කැලෑවල් ගානේ යන්නේ කලාතුරකින්. මේ පැත්තේ හරියට කෙසෙල් වගා කරනවා. මේ වගේ වතු වැඩට නම් අපි එකතු වෙනවා. මාළු අල්ලනට එහෙම යන්ඩ දෙන්නේ නෑ'' (පුරුෂ, හේනානිගල).

හඳුන්වා දෙන ලද නූතන අධ්‍යාපන ක්‍රමය, ආදිවාසී ප්‍රජාවගේ සංස්කෘතික ලක්‍ෂණ අනුව සමනුපාත කොට නැත. මෙය ප්‍රතිපත්තිමය උභතෝකෝටිකයක් ඇති කරයි. ආදිවාසී සුබසාධනය සඳහා නවීනත්වය කේන්ද්‍රකොටගත් අධ්‍යාපනයක් ලබා දිය යුතු ද යන්න ගැටලු සහගත ය. නූතන විද්‍යාත්මක අධ්‍යාපන ක්‍රමයෙහි මූලික පදනම් ගොඩ නැගී තිබෙන්නේ නවීනත්ව දෛනික චර්යාවක් ගොඩ නැගීම කේන්ද්‍රකොටගත් පරමාර්ථ ආශ්‍රයෙනි. මෙම තත්ත්වය වැදි සමාජයන් වෙත ආරෝපණය කිරීම මානව කේන්ද්‍රණවාදී ප්‍රයත්නයකි. වැදි සමාජය, නවීන සමාජ සමග සංසන්දනය නොකළ යුතුය. එබැවින්, ආදිවාසී සමාජ සහ ඒවායේ අධ්‍යාපන ප්‍රතිපත්ති සම්බන්ධ සුවිශේෂ සාකච්ඡාවක් ඇති විය යුතුය. පොදු අධ්‍යාපන ප්‍රතිපත්තියක් යටතට ආදිවාසී සමාජය කැඳවීම එතරම් යෝග්‍ය නොවේ. එසේ වුවත්, ආදිවාසී සමාජ සුභසාධනය සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සංකීර්ණ ක්‍රියාවලියක් බවට පත් වී තිබෙන්නේ, එහි අපේක්ෂිත ප්‍රතිපල ළඟා කර ගැනීමට දුෂ්කරව ඇති බැවින්ය. බොහෝ දුරට වැදි සමාජවල මූලික අපේක්‍ෂා සහ අධ්‍යාපනය මගින් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු අතර වෙනසක් පවතියි. වැදි සමාජයේ මූලික සමාජ අපේක්ෂා නූතන සමාජ ක්‍රමයට අනුගත කිරීම මානව කේන්ද්‍රතාවාදී ප්‍රයත්නයකි.

වැදි සමාජයද සුවිශේෂ සමාජ ක්‍රමයකි. එකී සමාජගත පුද්ගලයන් ඔවුන්ට සුවිශේෂී වූ සංස්කෘතියක් ගොඩ නගා ගෙන ඇති අතර, එයට අනුකූලව සමාජ-පෞරුෂය නිර්මාණය කොට ගෙන ඇත. මෙවැනි තත්ත්වයක් තුළ, නවීන අධ්‍යාපන විධි නියම හඳුන්වා දීම තුළින් සංස්කෘතික වෙනසක් ඇති විය හැකි අතර ඔවුන්ගේ පෞරුෂ වෙනසකටද එය හේතුවක් වනු ඇත. මෙහි ප්‍රතිඵලය වන්නේ, වැදි සමාජය තුළ අස්ථාවරත්වයක් ගොඩ නැගීමය. ස්වකීය සංස්කෘතිය සහ පෞරුෂයට අනුගත වූ වැදි සමාජය, වේගයෙන් වෙනස් වන මහා සමාජ සංස්කෘතියටද ප්‍රතිචාර දැක්විය යුතුව ඇත. මෙය ප්‍රජානන දිශානතියේ යම් වෙනසක් ඇති කරයි. ස්වකීය සංස්කෘතිය, වෙළෙඳ භාණ්ඩයක් බවට පරිවර්තනය කර ගැනීම එයට එක් නිදසුනකි. මේ තුළ සමාජ සංවර්ධනයකට වඩා, පරාධීන මානසිකත්වයක් ඉස්මතු වන ආකාරය නිරීක්‍ෂණය කළ හැකිය.

ආදීවාසී ප්‍රජාවගේ ජීවන වෘත්තිය සහ පාරිසරික සංරක්‍ෂණය සම්බන්ධයෙන්, ප්‍රාදේශීය සහ නාගරික පරිපාලකයන් විසින් සිදු කරනු ලබන අගය විනිශ්චයද ස්ථිරසාර සංවර්ධනයක් කෙරෙහි බාධා ඇති කරයි. බොහෝ දුරට ආදීවාසීන් වැනි විශේෂිත ප්‍රජාවගේ අවශ්‍යතාද නවීනත්ව අගය හෝ ධර්මතා මගින් විනිශ්චය කිරීම අවස්ථාවෝචිත නොවේ. අදාළ ප්‍රජාවගේ ස්ථිරසාර පැවැත්ම විනිශ්චය කළ යුතු වන්නේ ඔවුන් ජීවත් වන සමාජ අවස්ථාවලට සාපේක්‍ෂ වශයෙන්ය. ආදිවාසී සමාජවල ආර්ථික හා සමාජ සංවර්ධන ආස්ථාන නාගරික හෝ ග්‍රාමීය සංවර්ධන මූලධර්ම මගින් විග්‍රහ කිරීම යෝග්‍ය නොවේ. පූර්ව කාලීන සංවර්ධන වැඩසටහන් තුළ එවැනි සුවිශේෂ අවධානයක් නොපැවති බැවින්, ප්‍රජාවගේ ජීවන තත්ත්වල ස්ථිරසාරභාවය නැවත ගොඩ නැගීම නව වැඩසටහන්වල මූලික අභිමතාර්ථයක් විය යුතු බවද පෙනී යයි.

ISSN 2756-925X ISSN 0236-2090
cc BY NC

සරල සමාජවල මානව-අපේක්ෂා සහ ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථයන් අතර ද සමගාමී දිශානතියක් නොමැති බවක් පෙනේ. බුද්ධිමය කතිකා මගින් හැඩගන්වන ලද උක්ත අභිලාෂ පැහැදිලි නවීනත්වතා ලක්ෂණ පෙන්නුම් කරන අතර නාගරික හෝ ප්‍රධාන ප්‍රවාහයේ ආශා නියෝජනය කිරීමක් ද සිදු වෙයි. පාරිසරික ආරක්ෂණය සත්‍ය වශයෙන් ම අවශ්‍ය වන්නේ එහි විනාශයක් පෙන්නුම් කරන නාගරික සමාජ ආශ්‍රිතව ය. එසේ ද වුවත් ආදිවාසී සමාජයන්හි ජන ජීවිතය බොහෝ දුරට සකස් වී තිබෙන්නේ පාරිසරික සංරක්ෂණයක් ස්ථාපනය වන ආකාරයෙන්ය. ආගමික වශයෙන් පවතින විශ්වාස මගින් අදාළ ප්‍රජාව පැහැදිලි වශයෙන්ම වනාන්තර, ජල මූලාශ්‍රය ආදී ස්වභාවික ස්ථාන දේවත්වයට හෝ අධිභෞතික ස්ථානයකට පත් කරන බැවින් එය අනිසි ලෙස භාවිතයෙන් වැළකෙයි. එබැවින් ස්වභාවික ආදිවාසී පැවැත්ම තුළ ස්ථිරසාර භාවය පිළිබඳ මූලධර්ම අන්තර්ගත වී තිබේ. එසේ වුවත් බාහිර මැදිහත්වීමක් සහිත ප්‍රතිපත්ති මගින් ස්වභාවික ක්‍රමවේදය වෙනස් කරමින් කළමනාකරණ තත්ත්ව ඇති කිරීමෙහිදී අදාළ ප්‍රජාව නීතිමය වරදකරුවන් බවට පත් කිරීම ප්‍රධාන ගැටලුවක් බවට පත් වී ඇත.

> ''ආදිවාසී සමාජය, වෙනත් සමාජවල ව්‍යුහමය ස්වභාවයට වඩා වෙනස් ආකාරයෙන් ගොඩ නැගී ඇත. බොහෝ දුරට සමාජ ව්‍යුහය සකස් වීම කෙරෙහි සරල ආගමික චින්තන රටා මූලික වී ඇත. ආගමික චින්තනය, තෝටම හෝ ආත්ම වන්දනය මූලික කොට ගෙන ගොඩ නැගී ඇත. කන්දේ දෙවියෝ, මහලොකු අම්මා, නෑ යකුන් වැනි ආත්ම වන්දනා ක්‍රම මේ සමාජය තුළ දක්නා ලැබේ. මෙයට අමතර වශයෙන් තෝටම වන්දනයද දක්නට ලැබේ. තෝටම වුවත්, මියගිය ඥාතීන්ගේ ආත්ම හා සම්බන්ධ වන බවක් විශ්වාස කරයි. මෙහි ගම්‍ය කෘත්‍ය වන්නේ, මූලික පරිභෝජනය සඳහා සහ ජීවන පැවැත්ම අරමුණු කරගෙන පාරිසරික සම්පත් භාවිත කළත්, ඒවා ආරක්ෂා කර ගෙන ඉදිරියට පවත්වා ගෙන යාමට උත්සාහ කිරීමය. වනාන්තර, ගංගා, සතුන් ශුද්ධ වස්තු යැයි පිළිගන්නා බැවින්ය.'' (ඍජු නිරීක්ෂණ අනුසාරයෙන් සකස් කරන ලද ආඛ්‍යානයකි).

පාරිසරික ප්‍රතිපත්ති සකස් කොට ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන පරමාර්ථය වන්නේ පාරිසරික විනාශය අවම කිරීම සහ පාරිසරික ජීවිබව ආරක්ෂා කර ගැනීමය. මෙ වැනි ප්‍රතිපත්ති අවශ්‍ය වන්නේ, සත්‍ය වශයෙන්ම පාරිසරික විනාශයකට දායක වන පුද්ගලයන්ගේ ක්‍රියාකාරීත්වය නිසි ආකාරයෙන් කළමනාකරණය කිරීම සඳහාය. එසේ වුවත්, වැදි සමාජය පාරිසරික විනාශයකට දායක වන සමාජයක් වශයෙන් පිළිගත නොහැකිය. සමාජ ව්‍යුහය තුළින්ම පාරිසරික ආරක්ෂණය සඳහා වැඩපිළිවෙළක් ගොඩ නගා ගෙන ඇති බැවින්ය. මෙවැනි තත්ත්වයක් තුළ පාරිසරික ප්‍රතිපත්ති සහ නීති මගින් ආදිවාසී කණ්ඩායම් වැඩි පීඩනයකට පත් වන්නේ ඔවුන්ගේ දෛනික ජීවිතය පරිසරය මත සමපාත වන බැවින්ය.

සර්ව සුබවාදීත්වයක් පෙන්නුම් කළත්, වාර්ගික හෝ බහුවිධ සමාජ කණ්ඩායම් සහිත සමාජ ක්‍රමයක් තුළ සමාජ සුබසාධන අභිලාෂ ළඟා කර ගැනීම සඳහා නිර්දේශ කරනු ලබන මහා පරිමාණ හා අති ව්‍යාප්ත සංවර්ධන ප්‍රතිපත්ති මගින් සරල සමාජ ස්තර නියෝජනය නොවේ. පූර්ව මහවැලි

ISSN 2756-925X ISSN 0236-2090
CC BY NC

සංවර්ධන ව්‍යාපෘතිය මගින් පොල්ලේබැද්ද, දානියගල වැනි ප්‍රදේශවල ආදිවාසී ප්‍රජාව ''සංවර්ධනය'' නමැති කතිකාවට අනුගත කරමින් නැවත පදිංචි කිරීම එවැනි වැඩසටහනකි. ග්‍රාමීය සමාජ ක්‍රමයක් සම්බන්ධයෙන් අත්දැකීම් විරහිත හා නූතනත්ව අගය සම්බන්ධ අවබෝධයක් නොමැති සමාජ ස්තරයක්, අස්වාභාවික වශයෙන් නැවත පදිංචි කිරීමෙහි වැඩසටහන් යටතට ගැනීම ස්ථිරසාර සංවර්ධනය කෙරෙහි පැහැදිලි බාධාවන් ඇති කරනු ලැබිණ. 2030 න්‍යාය පත්‍රය යටතේ සර්වසාධාරණ සහ සමානාත්මතා සංවර්ධනයක් ඇති කිරීමෙහිදී නැවත පදිංචි කරන ලද ආදිවාසී කණ්ඩායම්වල ජීවන තත්ත්ව නගා සිටුවීම පිළිබඳ අභියෝගය ද ඉදිරියට පැමිණ තිබේ.

මහවැලි සංවර්ධන ව්‍යාපෘතියේ එක් වැඩ පිළිවෙලක් වශයෙන් වැදි සමාජ කණ්ඩායම් හේනානිගල වැනි ප්‍රදේශවල නැවත පදිංචි කරවනු ලැබිණ. එහි දී සංවර්ධන ප්‍රතිපත්ති සකස් කරනු ලැබ තිබෙන්නේ ''වැදි ප්‍රජාව, ග්‍රාමීය සමාජයකට හුරු කරවන'' ආකාරයෙන්ය. මෙහි ප්‍රතිපත්තිමය සන්දර්භ වියුක්තියක් දැකිය හැකිය. වැදි සමාජය, ගැමි සමාජ ව්‍යුහයට වඩා වෙනස් ය. ග්‍රාමීය සමාජයක දැකිය හැකි ව්‍යුහමය ලක්ෂණ එහි දැකිය නොහැකිය. සමාජ විකාසනයේ තවමත් ගැමි සමාජයක් දක්වා වැදි සමාජය පැමිණ නැත. මෙවැනි තත්ත්වයක් තුළ එකවරම වැදි ප්‍රජාව ගැමි සමාජයකට හුරු කරවීම පහසු කාර්යයක් නොවේ. ඓතිහාසික ශ්‍රී ලංකාවේ ගම පන්සල කේන්ද්‍රකරගත් සහ කෘෂිකර්මාන්තය මූලික කොටගත් සමාජ ඒකකයකි. එහි පුද්ගල ප්‍රජානන දිශානතිය (Foster, 1965) හෙවත් චින්තන ආකෘතිය, වැදි සමාජයට වඩා වෙනස්ය. මේ නිසා, ගැමි සමාජයක් ආකාරයෙන් සකස් කරන ලද නැවත පදිංචි කළ ප්‍රදේශ ආශ්‍රිතව විවිධ ගැටලු උද්ගත විය. ඥාතිත්ව රටාව වෙනස් වීම, වෛවාහික සම්බන්ධතාවල ස්වභාවය වෙනස් වීම, නිෂ්පාදන ව්‍යුහය වෙනස්වීම යනාදියෙහි ප්‍රතිඵලයක් වශයෙන් වැදි ප්‍රජාව සමාජ සුභසාධනකය වඩා අතෘප්තිකර ජීවන චර්යාවකට හුරු විය.

> ''දඹානට වඩා දානියගල සහ රතුගල වෙනස්. අපිට ඉන්නේ වෙනත් කියලා නායකයෙක්. අපි වන්නියලඇත්තෝ එක්ක ගනුදෙනුවක් කරන්නේ නෑ. අපි අදහන්නේ මහලොකු අම්මා. දැන් හේනානිගලට ආවට පස්සේ ගොවිතැන්ට හුරු වෙන්ඩ සිද්ද වුණා. ඒකත් කුඹුරු වැඩ නෙවෙයි. ඉඩම් බහුතරයක් අපට හිමි නැහැ. අපි වෙනත් ව්‍යාපාරිකයන්ගේ වතුවල වැඩ කරන එකයි කරන්නේ. අපිට තිබෙන්නේ බොහොම පොඩි ඉඩක්. එකේ ඉරිගු හරි මොනව හරි තමයි වගා කරන්නේ. පන්සලට දානෙත් ගෙනියනවා.'' (ස්ත්‍රී, හේනානිගල)

> ''මේ පළාත්වල මිනිස්සු හරියට දුක් විඳිනවා. මහා පරිමාණ කෙසෙල් ව්‍යාපාරිකයන්ගේ වතුවල වැඩ කරන්ඩ යනවා. දැන් ඉන්න ළමයි නම් යමක් ඉගෙන ගන්නවා. ඒ කාලේ පරණ මිනිසුන්ට මොන අවබෝධයක්වත් නෑ. ඒ අය අද සමාජෙ ගැන දැනගන්නේ කොහොම ද? පන්සලට වුණත් දානේ ගේන්ඩ මේ අය දැන් හුරු වෙලා. ඒ උනත් ඒ අය තවමත් අතීතයේ ජීවත් වන බවක් මට හැඟෙන්නේ''. (පුරුෂ, හේනානිගල)


ISSN 2756-925X ISSN 0236-2090

මහා පරිමාණ බුද්ධිමය කතිකාවන් මගින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශය, සත්‍ය සමාජ ක්‍රියාකාරීත්වයට සාපේක්ෂව ප්‍රතිපත්තිමය වශයෙන් ක්‍රියාත්මක කිරීමෙහිදී අදාළ සමාජ ක්‍රමවලහි ආභ්‍යන්තරික ක්‍රියාකාරීත්වය හෝ සංස්කෘතික විකාශනය කෙරෙහි අවධානයක් යොමු නොවේ. මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය මගින් නැවත පදිංචි කළ ප්‍රජාව සඳහා වී ගොවිතැන පුරුදු කිරීම සහ කෙසෙල් වගාව සඳහා අවස්ථාව ලබා දීම යෝග්‍ය වැඩසටහනක් නොවේ. ගොවිතැන පිළිබඳ පූර්ව අත්දැකීමක් හෝ වෙළෙඳපොළ යථාර්ථය සම්බන්ධ අවබෝධයක් නොමැති ප්‍රජාව ක්‍රමානුකූල ස්වභාවික විකාශනයකින් තොරව අදාළ නවීනත්ව අගය වෙත ගෙන ඒම ස්ථිරසාර සංවර්ධනයක් වශයෙන් අර්ථකථනය කිරීම අපහසුය. ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථ ළඟා කර ගැනීම සඳහා රජය විසින් නිර්දේශ කරනු ලබන සමාජ ප්‍රතිපත්තිවල පැහැදිලි වශයෙන්ම අදාළ සමාජවල සංස්කෘතික විකාශනය කෙරෙහි සංවේදී අවධානයක් පැවතිය යුතුය.

දඹාන, පොල්ලේබැද්ද වැනි ප්‍රදේශවලට ආවේණික වූ ආදිවාසී ප්‍රජාවගේ දේශපාලනික, සමාජ, ආර්ථික සහ ආගමික විකාශනය සමස්ත ශ්‍රී ලංකාවේ සංස්කෘතික හෝ දේශපාලනික විකාශනයට සමගාමී වූවක් නොවේ. මේ නිසා බහුතර ප්‍රජාවක් අරමුණු කරගනිමින් සකස් කරනු ලබන වැඩසටහන් මගින් සුවිශේෂී සමාජ කණ්ඩායම්වල අපේක්ෂාවන් සංතෘප්ත කිරීමේ හැකියාව අවමය. බාහිර මැදිහත්කරුවන් විසින් සංවර්ධන සංතෘප්තිය යනුවෙන් කරනු ලබන විග්‍රහය ආදිවාසී ප්‍රජාවගේ විග්‍රහයට වඩා අතිශය වෙනස්ය. ඔවුන්ගේ සංවර්ධන සංතෘප්තිය වෙසෙසින් ස්වකීය අනන්‍යතා සහ සංස්කෘතික අගය මත රඳා පවතියි. මේ හේතුවෙන්, ආදීවාසී ප්‍රජාවද සමස්ත සංවර්ධන වැඩසටහන්වල කොටස්කරුවන් බවට පත් කිරීමෙහිදී හුදෙක් ඔවුන්ගේ අනන්‍යතා වියුක්ත නොවන සහ සමස්ත සමාජ ක්‍රමය කෙරෙහි සාධාරණත්වයක් ඇති වන ආකාරයෙන් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම අභියෝගයක් බවට පත් වේ. සුවිශේෂ සමාජ කණ්ඩායමක් වශයෙන් ප්‍රධාන සමාජ ප්‍රවාහය තුළ පැහැදිලි සහ ස්ථිරසාර ස්ථානයක් ලබා දීම මෙයින් අදහස් කරනු ලැබේ.

ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා පරිපාලනමය මැදිහත්වීමක් සහිත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අවශ්‍ය බව මුලින් ද පෙන්වා දෙනු ලැබිණ. වී ගොවිතැන සහ මිරිදිය ධීවර කර්මාන්තය ව්‍යාප්ත කිරීම අරමුණු කොටගෙන වාරිමාර්ග සකස් කිරීම මුල් කාලීන ප්‍රතිපත්තිවල ප්‍රධානත්වයක් ගනු ලැබිණ. ආදිවාසීන් ස්වකීය මුල් වාසස්ථානවලින් ඉවත් කොට වෙනත් ප්‍රදේශයවල පදිංචි කිරීම මෙහි ප්‍රතිඵලයකි. අතිශය ව්‍යුහගත පරිපාලන මැදිහත්වීමක් මගින් මෙම ක්‍රියාවලිය කළමනාකරණය කරනු ලැබිණ. මේ නිසා රාජ්‍ය පරිපාලන තන්ත්‍රය සහ ආදීවාසී ප්‍රජාවට අනන්‍ය වූ පරිපාලන ව්‍යුහය අතර ගැටීමක් ඇති වෙයි. සමාජ ආයතන දෙකක් අතර පාලනමය විසමතා ඉස්මතු වීම සමාජ ක්‍රමයෙහි විසංවිධානයට හේතු වේ.

පාලන ක්‍රමයක් වුවත් හුදෙක් අස්වාභාවික වශයෙන් ගොඩනැගෙන ව්‍යුහ නොවේ. නූතන රාජ්‍යයේ පරිපාලන ව්‍යුහය, නවීනත්ව සමාජ අගයන්ට සමපාත වන ආකාරයෙන් සකස් වී තිබේ. එමෙන්ම ආදීවාසී පරිපාලන ව්‍යුහයද ආදීවාසී සංස්කෘතික ධර්මතාවන්ට සමපාත වූවකි. එසේ වුවත් ආස්ථාන දෙකකට අයත් ව්‍යුහ දෙකක් එකම ප්‍රජාවක් වෙත බලපෑම් කිරීම අදාළ ප්‍රජාවගේ ජීවන ගුණය කෙරෙහි ඍණාත්මක වශයෙන් බලපෑම් කරයි. අධ්‍යයනයට භාජනය වූ ප්‍රජාවගේ සංස්කෘතික අනන්‍යතාව, වෘත්තීය උපායමාර්ග යනාදියෙහි විසමතා නිර්මාණය කිරීමට මෙම තත්ත්වය හේතු වී



ISSN 2756-925X ISSN 0236-2090

තිබේ. එබැවින් පරිපාලනමය ව්‍යුහ අතර ගැටීම අවම කිරීම 2030 න්‍යාය පත්‍රය මුහුණ දෙනු ලබන අභියෝගයක් වශයෙන් පෙන්වා දිය යුතුය. නවීනත්ව ලක්‍ෂණ සහිත පරිපාලන ක්‍රමයක් වෙතට ආදිවාසී ප්‍රජාව ඇතුළත් කර ගැනීම ගැටලු සහගත වන්නේ, ප්‍රාදේශීයව සුවිශේෂ වශයෙන් පවතින පරිපාලන ක්‍රමයකටද ඔවුන් ඇතුළත් වී ඇති බැවින්ය. දඹාන, පොල්ලෙබැද්ද, රතුගල, දානියගල වැනි ප්‍රදේශවලට සුවිශේෂී වූ දේශපාලන බල රටාවක් තිබේ. ඒ අනුව යමින්, දෛනික චර්යාවේ වෙනස්කම්ද ඇති වන බව පෙනේ. මෙවැනි තත්ත්වයක් තුළ, සංවර්ධනය ඉලක්ක කොට ගෙන නව පරිපාලන ව්‍යුහයක් ස්ථාපනය කිරීමෙන් කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති විය හැකිය. එකම සමාජ ව්‍යුහයක් තුළ බහුවිධ විසමතා සහිත පරිපාලන ක්‍රම දෙකක් අනුව ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් පුද්ගලයා ප්‍රජානනමය වශයෙන් ගැටලුවකට මුහුණ දෙන ආකාරය රූප සටහන 2 හි පෙන්වාදී ඇත. පරිපාලන ආකෘතික දෙකක් ක්‍රියාත්මක වීම ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය කරනු ලබන්නේ, ප්‍රජානනයෙහි ගැටලු ඇති කළ හැකි බැවින්ය.

> ''අපේ නායකයා අපිට අවසර දීලා තියෙන්නේ බෙහෙතක් හේතක් හොයාගෙන එන්ඩ කැලේට යන්ට. ඒත් නිලධාරී මහත්තුරුන්ට අසු උනොත් අපිට දඩ ගහනවා.... ඒ කාලෙ ඉඳලා අපේ ගැහැනු ළමයි ගෙවල්වල හිටියේ. පිටින් එන කවුරුන්ටවත් අපි ගැහැනු ළමයින්ව හෝ ගැහැනුන්ව පෙන්වන්නේ නෑ. දැන් මේ ගැහැනු ළමයිත් ඉස්කෝලෙට යවන්ඩ වෙලා තියෙනවා'' (පුරුෂ, රතුගල).

උක්ත උධෘතයෙන්, පරිපාලන ක්‍රම දෙකක් ක්‍රියාත්මක වීමෙහිදී ප්‍රජාව ප්‍රජානනමය වශයෙන් ගැටලුවකට මුහුණ දෙන ආකාරය පැහැදිලිව පෙන්නුම් කොට ඇත. ඓතිහාසික වශයෙන් පිළිගත් ප්‍රතිමාන සහ නව පරිපාලනය විසින් පෙන්වා දෙන ප්‍රතිමාන අතර සමමිතියක් නොමැති වීම හේතුවෙන්, වැදි සමාජය යම් අපහසුතාවකට මුහුණ දෙයි.

**රූප සටහන 2 :** එකම සමාජ ව්‍යුහයක් තුළ පරිපාලන ආකෘති දෙකක්




ISSN 2756-925X ISSN 0236-2090

ප්‍රාදේශීය පරිපාලන නිලධාරීන් ආදිවාසී ප්‍රජාව නොසලකා හැරීම සමාජ ක්‍රමය තුළ මුල් බැසගත් ගැටලුවකි. මෙය සාම්ප්‍රදායික වශයෙන් පවතින පරිපාලන දුර්වලතාවක් වුවත් සුවිශේෂ සමාජ කණ්ඩායමක් ආශ්‍රිත පරිපාලනමය ක්‍රියාකාරීත්වය විශේෂයෙන් සලකා බැලීම අවශ්‍ය වේ. ජාතික රාජ්‍ය පරිපාලනය සම්බන්ධ අවබෝධයක් නොමැති ආදිවාසී ප්‍රජාව ''සමාජ සංවර්ධනය'' නමැති අර්ථයෙන් පරිපාලන ක්‍රියාවලියකට යටත් කිරීමෙන් කිසිදු ප්‍රතිඵලයක් අයත් වී ඇති බවක් නොපෙනේ. ප්‍රාදේශීය පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් නොමැති බැවින්, අදාළ ආයතන සමග දක්වන සම්බන්ධතාද අවමය. පරිපාලන නිලධාරීන් අදාළ ප්‍රජාවගෙන් ඉස්මතු වූ හෝ නියෝජනය කරන නිලබලවාදීන් නොවන බැවින් නෛසර්ගික වශයෙන් ම සරල සමාජ කණ්ඩායම් පිළිබඳව පවතින සංවේදීත්වය අවම බව නිරීක්ෂණය කරනු ලැබිණ. 2030 න්‍යාය පත්‍රය අනුව, සමාජ සංවර්ධනයක් ස්ථාපනය කිරීමෙහිදී පරිපාලන නිලධාරීන්ගේ සක්‍රීය සහ සාධාරණ ක්‍රියාකාරීත්වය අතිශය වැදගත්ය. එසේ වුවත්, සාම්ප්‍රදායික නිලබලවාදී සංස්කෘතියකට අනුගත වූ පරිපාලන නිලධාරීන් ආදිවාදී සමාජ කණ්ඩායම්හි අපේක්ෂාවන් ආමන්ත්‍රණය කිරීමෙහිදී පසුගාමී ස්වභාවයක් පෙන්නුම් කිරීම යම් ගැටලුකාරී තත්ත්වයකි.

සමාජ ක්‍රමයක් තුළ පුද්ගලයෙකුට හිමි ස්ථානය දීර්ඝ කාලීනව විකාශනය වන ව්‍යුහමය ක්‍රියාවලිවල ප්‍රතිඵලයක් වශයෙන් තීරණය වේ. ස්ත්‍රීන් සහ පුරුෂයන් යම්කිසි සමාජ ක්‍රමයක් තුළ නියෝජනය කරනු ලබන ආස්ථානය ව්‍යුහමය වශයෙන් තීරණය කොට තිබේ. ව්‍යුහමය වශයෙන් නිර්වචනය වන කාර්ය කොටස් සහ භූමිකා අදාළ සමාජවල පැවැත්ම කෙරෙහි අතිශය අවශ්‍ය සාධකයක් වශයෙන් ක්‍රියාත්මක වෙයි. කාර්ය කොටස් සහ තත්ත්ව සංසන්දනාත්මක වශයෙන් විග්‍රහ කිරීම බොහෝ දුරට යෝග්‍ය නොවේ. පුරුෂයන් සහ කාන්තාවන් සම්බන්ධයෙන් ආදීවාසී සමාජවල පවතින විග්‍රහයද බොහෝ දුරට ව්‍යුහමය තත්ත්වලට සමගාමී වශයෙන් තීරණය කොට තිබේ. පීතෘ මූලික ආධිපත්‍යයක් සහිත සමාජ ක්‍රමයක් වශයෙන් කාන්තාවන් මූලික හා ප්‍රධාන යැයි සලකනු ලබන කාර්යවලින් බැහැර කොට තැබීම සම්ප්‍රදායික වශයෙන් එහිදු සිදු වන්නේය. ධනවාදී හෝ නූතනත්ව සමාජ ලක්ෂණයවලින් යුක්ත නොවූ ආදිවාසී සමාජයන්ගේ අනන්‍යතාවට අනුකූලව ස්ත්‍රී සහ පුරුෂයන්ගේ සමාජ ආස්ථානය හෝ සමාජයක් තුළ හිමිවන ස්ථානය තීරණය කොට තිබේ. මෙය නවීනත්ව සමාජ ලක්ෂණයන් සමග සංසන්දනාත්මක වශයෙන් විග්‍රහ කොට ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සමාජ ක්‍රමවල විසංවිධානයට හේතු වෙයි. ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමෙහිදී ආදිවාසී සමාජ ව්‍යුහවල කාන්තාවන් සංවර්ධන වැඩසටහන් සඳහා කවර ආකාරයෙන් සම්බන්ධ කර ගත යුතුද යන්න පිළිබඳ පැහැදිලි ගැටලු ඉස්මතු විය හැකිය.

2030 සංවර්ධන න්‍යාය පත්‍රය අනුව සමාජ සංවර්ධන කාර්යයෙහිදී කාන්තාවගේ දායකත්වය ප්‍රමුඛ වශයෙන් අවධාරණය කරනු ලැබේ. එසේ වුවත් සාමාන්‍ය ආදීවාසී සමාජ ක්‍රමයක් තුළ කාන්තාවන් හුදෙක් ප්‍රධාන ප්‍රවාහයේ කාර්යවලින් බැහැර වූ හෝ ආන්තිකරණයට භාජනය වූ පාර්ශ්වයක් වශයෙන් පළමුව පිළිගත් මතවාද අනුව ප්‍රතිපත්ති පිළියෙළ කිරීම ස්ථිරසාර සංවර්ධනයට හේතු නොවේ. විශේෂයෙන්ම ආදිවාසී කාන්තාවන් විසින් අදාළ සමාජවල පැවැත්ම කෙරෙහි සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරනු ලබයි. පුරුෂයන් සහ කාන්තාවන් අතර පවතින අන්‍යෝන්‍ය කාර්ය බෙදා ගැනීම සහ අනුපූරණය සමාජවල ස්ථාවරත්වයට හේතු වන බව පෙනේ.


ISSN 2756-925X ISSN 0236-2090
CC BY NC

මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය අනුව නැවත පදිංචි කරවන ලද ආදිවාසී ප්‍රජාව ආශ්‍රිත අනපේක්ෂිත අර්බුද උද්ගත වීමටද මූලික හේතුවක වී තිබෙන්නේ පුරුෂයන් සහ කාන්තාවන් අතර කාර්ය කොටස් කෘත්‍රිම වශයෙන් වෙනස් කිරීම හෝ එසේ වෙනස් වීමට ඉඩ සලසා තිබීමය. නිදසුන් වශයෙන්, කාන්තාවන්ගේ පෞද්ගලික හා පොදු අවකාශවල ක්‍රියාකාරීත්වය වෙනස් කිරීම කෙරෙහි සමාජ ප්‍රතිව්‍යුහගත වී තිබීම පෙන්වා දිය හැකිය. හේනානිගල පදිංචි කරවන ලද වැදි කාන්තාවන්, මහා පරිමාණ ව්‍යාපාරික කෘෂිකාර්මික ඉඩම්වල සේවයෙහි නියුක්ත වීම සහ එයින් දෛනික වැටුපක් ලබා ගැනීම ඔවුන්ගේ මූලික සමාජ ආස්ථානයට වඩා වෙනස් වීමකි. මේ තුළින් කාන්තාව ආර්ථිකමය වශයෙන් බලසතුකරණයට යම් අවස්ථාවක් ලැබී තිබුණත්, වැදි පවුල් ව්‍යුහය වෙනස් වීම කෙරෙහි ප්‍රබල බලපෑමක් සිදු කොට ඇත. එමෙන්ම, නව සමාජ ක්‍රමයකට හුරු වීම සඳහා අකැමැත්තෙන් හෝ මෙතෙක් පවත්වා ගෙන පැමිණි සංස්කෘතික අනන්‍යතාවන් වෙනස් කර ගැනීමට සිදු වේ. මේ තුළ යම්කිසි බලපෑම් සහගත රාජ්‍ය මැදිහත්වීමක් පවතියි. එබැවින් ස්ථිරසාර සංවර්ධන පරමාර්ථ ආශ්‍රිත වැඩසටහන් සම්පාදනය කිරීමෙහිදී සමාජයෙහි ස්වභාවයට සාපේක්ෂ වශයෙන් අදාළ පුද්ගලයන්ගේ කාර්ය කොටස් නිර්වචනය කිරීම අවශ්‍ය වේ.

ආදිවාසී සමාජ සංවර්ධනය කිරීම නමැති කතිකාව තුළ සෞඛ්‍යය, අධ්‍යාපනය නමැති ප්‍රධාන අංශ දියුණු කිරීම කෙරෙහිද පසුගිය සංවර්ධන ව්‍යාපෘති මගින් අවධානය යොමු කරවනු ලැබිණ. නූතනත්ව අගය සහිත සෞඛ්‍ය පහසුකම් සහ අධ්‍යාපනික ක්‍රම ආදේශ කිරීම මෙහි මූලිකත්වයක් ගනු ලැබිණ. යම්කිසි ප්‍රතිපත්තියක් මගින් එවැනි නිර්දේශ ඉදිරිපත් කරනු ලබන අවස්ථා තුළ පූර්ව ව්‍යුහ කෙරෙහි බලපෑම් ඇති කරයි. ආදිවාසී සමාජ ආශ්‍රිතව ප්‍රාථමික සෞඛ්‍ය තත්ත්ව නංවාලීමෙහිදී එකී සමාජවල මූලික ව්‍යුහ වෙත කිසිසේත් නොගැළපෙන ක්‍රමයන් භාවිත කොට තිබිණ. සෞඛ්‍ය පහසුකම් සම්පාදනය කිරීමේ කාර්යයෙහිදී විශේෂයෙන්ම නව්‍ය ආකෘති භාවිත කළ යුතු වන්නේ ඌන පූර්ණ ක්‍රමයන් වශයෙනි. මෙතෙක් පවත්වාගෙන එනු ලබන සෞඛ්‍ය සම්ප්‍රදාය සහ වෛද්‍ය ක්‍රම වෙත මූලික අවධානයක් යොමු විය යුතුය. ඇතැම් අවස්ථාවලදී යක්ෂාවේශය හෝ නූතනාර්ථයෙන් මානසික රෝග වැනි තත්ත්වයන් සුව කිරීම සම්බන්ධ දේශීය සම්ප්‍රදාය අදාළ සමාජ ක්‍රමය තුළම පවතියි. පට-යකු නැටීම මාතෘ සෞඛ්‍යය සම්බන්ධ පිළිවෙතකි. නවීනත්ව අගය සහිත බාහිර ප්‍රතිත්ති කෘත්‍රිම වශයෙන් ආදේශ කිරීමට සාපේක්ෂ වශයෙන් මෙවැනි දේශීය පිළිවෙත් සම්බන්ධයෙන්ද අවධානය යොමු කිරීම සමාජ ක්‍රමවල ස්ථිරසාර සංවර්ධනය කෙරෙහි බලපෑම් කරනු ලබන බව පෙනේ. පිළිගත හැකි දේශීය ඥානයට සැලකිය යුතු හානියක් සිදු වීම සංවර්ධනයෙහි ස්ථිරසාරභාවය බිඳ වැටීමට හේතු වෙයි.

> ''මේ පළාත්වල හොඳ දේශීය වෛද්‍ය ක්‍රමයක් තිබුණා. හැබැයි ඒක සර්ව සම්පූර්ණ වෛද්‍ය ක්‍රමයක් නොවේ. එනමුත් වනාන්තරවලදී සර්පයෙක් කෑවම බෙහෙතක් කර ගන්න පුළුවන්. අස්ථියක් කැඩුණම ඒක පාදාගන්න හැකියාව තිබුණා. ඇස් පෙනීම හොඳ කර ගැනීමට බෙහෙත් තිබුණා. ඒත් ඉස්පිරිතාල ඉදි කරාට පස්සේ ගොඩක් ලෙඩ රෝග වලින් බේරීමට හැකි වූ බව පිළිගත යුතුයි. නමුත් හැම ලෙඩේටම රට ඉස්පිරිතාලෙට යන්ඩ බැහැනේ. රට ඉස්පිරිතාලවලට යන්ඩ පුරුදු උනාට පස්සේ අපේ දේශීය වෙදකම ටිකෙන් ටික

ISSN 2756-925X ISSN 0236-2090
CC BY NC

පිරිහී ගියා. දැන් ඇස් වෙදකමක් කරගන්න බෙහෙත් දන්නේ නෑ. සර්ප වෙදකම දන්න අයත් ඉන්නේ බොහොම ටික දෙනයි'' (පුරුෂ, දඹාන).

නව රෝහල් ඉදි කිරීම සහ සෞඛ්‍ය පහසුකම් ලබා දීම තුළින්, වැදි සමාජයෙහිද යම් සමාජ සුභසාධනයක් ඇති කළ හැකි වූ බවක් පෙනේ. එනමුත්, එහි අතුරු ප්‍රතිඵලයක් වූයේ මෙතෙක් කාලයක් පරපුරෙන් පවත්වා ගෙන පැමිණි වෙදකම් කෙරෙහි පැවැති අවධානය ගිලිහී යාමය. ප්‍රදේශයට සුවිශේෂී වූ රෝග සුව කර ගැනීම සඳහා එවැනි සුවිශේෂී දේශීය වෙදකම් භාවිත කිරීම විශේෂයෙන් වැදගත් වෙයි. එසේ වුවත්, නවීනත්ව ලක්‍ෂණ ක්‍රමයෙන් ව්‍යාප්ත වීමත්, පැවති වැදි සංස්කෘතිකාංග වෙනස් වීමත් හේතුවෙන් ඔවුන්ගේ දේශීය වෙදකම අභාවයට යමින් පවතියි. මේ හේතුවෙන්, ආදිවාසීන්ගේ අනන්‍යතාව සම්බන්ධ ගැටලුව තවදුරටත් පුළුල් විය හැකිය.

විශේෂිත සමාජ කණ්ඩායමක් වශයෙන් ආදිවාසී ප්‍රජාවටද මූලික අයිතිවාසිකම් පිළිබඳ නෛසර්ගික අයිතියක් හිමි බව පිළිගනු ලැබේ. එසේ වුවත්, පසු කාලීන ප්‍රතිපත්ති මගින් විද්‍යමාන වන්නේ නවීනත්ව අගය සහිත අයිතිය පිළිබඳ නෛසර්ගික හිමිකාරීත්වයක් ආදිවාසී ප්‍රජාවටද පවත්නේ යැයි බාහිර ප්‍රජාව විසින් කරනු ලබන අර්ථකථනය සාවද්‍ය ඉදිරිපත් කිරීමක් බවය. ආදිවාසී සමාජයෙන් බැහැර නවීන සමාජ විසින් හා නවීනත්ව අගය විසින් මෙහෙයවනු ලබන කාරක සාපේක්‍ෂ වශයෙන් වඩාත් හොඳ හෝ යෝග්‍ය යැයි අර්ථ දැක්වීම අතිශය මානව කේන්ද්‍රවාදී අර්ථ දැක්වීමකි. එසේ වුවත්, ආදිවාසී ප්‍රජාව විසින්ද නවීනත්ව අගය පිළිගත යුතු යැයි ප්‍රතිපත්ති නිර්දේශ කිරීම මානව හිමිකම් සම්බන්ධ සාවද්‍ය අර්ථකථනයකි. නැවත පදිංචි කළ ආදිවාසී ප්‍රජාව අතර බොහෝ දුරට නවීනත්ව අගය වෙත ගමන් කිරීමේ ප්‍රවණතාවක් පැවතියත් මූලික සංස්කෘතික අයිතිය තව දුරටත් භුක්ති විඳීමේ අවශ්‍යතාවක් පවතින බව පෙනී යයි.

''අපි කුවේණිගේ ඉඳන් පැවත එන මිනිස්සු. සිංහලයන්ට වඩා අපිට මේ රටේ අයිතියක් තියෙන්නේ. කන්දේ දෙයියෝ (සමන් දෙවියන්) යනු අපේ කෙනෙක්. ඒක නිසා මේ සංස්කෘතිය අපි පවත්වාගෙන යන්ඩ අවශ්‍යයි'' (ස්ත්‍රී, හේනානිගල).

මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාදුරුඔය ජලාශය ඉදි කිරීම හා ඒ ආශ්‍රිතව පූර්ව වැදි ප්‍රජාව නැවත පදිංචි කරවීමෙන් ධීවර කර්මාන්තය හා වී ගොවිතැන නංවාලීම අරමුණු කරනු ලැබිණ. ඉදි කිරීම් වශයෙන් මාදුරුඔය ජලාශය උසස් නිර්මාණයක් වුවත්, එහි ධීවර කටයුතු සඳහා අවකාශය තිබෙන්නේ නිශ්චිතව පෙන්වා දෙන ලද ප්‍රදේශ ආශ්‍රිතවය. හේනානිගල නැවත පදිංචිකරුවන්ගේ වාසස්ථානයට සමීප ඇළ මාර්ගය හෝ සමීපස්ථ ජලාශ වපසරිය ධීවර කර්මාන්තය සඳහා භාවිත කළ නොහැකිය. විශේෂයෙන්ම ඇළ මාර්ගය සාමාන්‍ය ජන ජීවිතයේ කටයුතු සඳහා භාවිත කිරීම අපහසු වන්නේ ඉදිකිරීම් කාර්යයෙහිදී ජල ප්‍රවාහනයේ කාර්යක්‍ෂමතාව කෙරෙහි අවධානයක් යොමු කොට පැවතියත්, එහි භාවිතය නොසලකා හැරීම හේතුවෙන්ය. 2030 න්‍යාය පත්‍රයට සාපේක්‍ෂ වශයෙන් ස්ථිරසාර සංවර්ධනයක් ස්ථාපනය කිරීමෙහිදී ඉංජිනේරුමය මැදිහත්වීමක් සහිත ඉදිකිරීම් කෙතෙක් දුරට ප්‍රජාවගේ භාවිතය සම්බන්ධයෙන් අදාළ වන්නේද යන්න සලකා බැලිය යුතු වන්නේ එබැවින්ය.

ISSN 2756-925X ISSN 0236-2090

සංවර්ධනය වෙමින් පවතින සමාජයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ඇතැම් ආන්තීකෘත සමාජ කණ්ඩායම්වල සංවර්ධනය ස්ථාපනය කිරීමෙහිදී ඉස්මතු වන ප්‍රධාන අභියෝගයක් වන්නේ පූර්ව ප්‍රතිපත්ති ආශ්‍රිතව ගොඩනගන ලද ව්‍යුහ ප්‍රතිසංස්කරණය කිරීමය. දඹාන, පොල්ලේබැද්ද වැනි ආදිවාසී ප්‍රදේශවල ප්‍රජාව හේනානිගල නැවත පදිංචි කරවනු ලැබිණ. එහි අවසාන පරමාර්ථය වූයේ ප්‍රජාවගේ ආර්ථික සහ සමාජ සංවර්ධනයයි. එසේ වුවත්, පසුවිපරම්වලදී පැහැදිලි වන්නේ අපේක්ෂිත සමාජ සංවර්ධනයක් වෙත මෙකී ප්‍රජාව සමීප වී නොමැති බවය. මේ අනුව නව ප්‍රතිපත්ති සැලසුම් කිරීමෙහිදී සර්වාකාරයෙන් ගොඩනගන ලද ව්‍යුහයක් නැවතත් ප්‍රජාවගේ අපේක්ෂාවන් සමග සමපාත වන ආකාරයෙන් සකස් කිරීම සම්බන්ධ ඇතැම් අභියෝගය ඉදිරියට පැමිණෙයි.

දඹාන, හේනානිගල යන ප්‍රදේශවලට අයත් සරල සමාජ කණ්ඩායම්වල දේශපාලන අනන්‍යතා පැහැදිලි වශයෙන් වෙනස් වන අතර විභේදිත බවක්ද පෙන්නුම් කරයි. හේනානිගල ආදිවාසී නායකයන්ගේ පාලන ආස්ථානය දඹාන ආදිවාසී නායකයන්ගේ ආස්ථානයට වඩා වෙසෙසින් වෙනස්ය. මෙය එකම ප්‍රජාවක් (සමාජ කණ්ඩායමක්) අතර විභේදිත තත්ත්ව ඉස්මතු කිරීම කෙරෙහි බලපෑම් කරනු ලබයි. එමෙන්ම නවීන වශයෙන් ඇති කරන ලද වෘත්තියට අනුගත වීම සඳහා අවස්ථා ව්‍යුහමය වශයෙන් සකස් නොවීමද ප්‍රධාන ගැටලුවකි. ධීවර කර්මාන්තය හෝ කෘෂිකර්මාන්තය සම්බන්ධ දැනුමක් ආදිවාසී ප්‍රජාවන්ගෙන් අපේක්ෂා කළ නොහැකිය. ඔවුන් හුදෙක්ම ආදිවාසී ප්‍රජාවක් වශයෙන් භාවිත කළ නිෂ්පාදන ක්‍රමය නූතන ප්‍රතිපත්තිමය අපේක්ෂා හා සමපාත නොවේ. එබැවින් නූතන තත්ත්වයට යෝග්‍ය හැකියා මෙම ප්‍රජාවගෙන් අපේක්ෂා කළ නොහැකිය. මෙය සමාජ සංවර්ධනයෙහි අවගමනයට හේතුවක් වේ. නව අපේක්ෂාවලට සමනුපාතික වශයෙන් ප්‍රජාව අනුගත නොවීම හේතුවෙන් ඉදිරි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිදීද අනපේක්ෂිත ගැටලු ඉස්මතු වීමට ඉඩ තිබේ. මූලික අවස්ථාවල දී රාජ්‍ය මැදිහත්වීම මත යම්කිසි විශ්වාසයක් රඳවා පැවතියත්, නව ප්‍රතිපත්ති සම්බන්ධ එවැනි විශ්වාසයක් වර්ධනය කිරීම පහසු නොවේ. මේ හේතුවෙන් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහිදී ප්‍රජාව සම්බන්ධ කර ගැනීම පිළිබඳ ගැටලු ඉස්මතු විය හැකිය.

වාණිජකරණයට භාජනය වීම සහ සංචාරක කර්මාන්තයන්හි මූලිකාංගයක් බවට පත් වීම, ප්‍රජාවක් වශයෙන් ආදිවාසී සමාජයන්හි ස්ථිරසාර සංවර්ධනය කෙරෙහි බාධා ඇති කරවන බව පෙනේ. දඹාන ප්‍රදේශයෙහි වැදි ප්‍රජාවන්ගේ මූලික ආදායම් උත්පාදන මාර්ගයක් වන්නේ ස්වකීය සංස්කෘතිය දේශීය හෝ විදේශීය සංචාරකයන් වෙත අළෙවි කිරීම ය. ප්‍රධාන ප්‍රවාහයේ සමාජ කණ්ඩායම් වුවත් වැදි ප්‍රජාව වෙනම සමාජ කණ්ඩායමක් වශයෙන් ලේබල්කරණය කිරීම හේතුවෙන් මෙවැනි තත්ත්වයක් ඉස්මතු වී තිබේ. වාණිජකරණය මගින් ඇති කරනු ලබන උක්ත ආන්තීකරණය මූලික නිෂ්පාදන මාර්ගයක් වශයෙන් භාවිත කිරීමට වැදි ප්‍රජාවද උත්සාහ කරයි. මෙය අදාළ සමාජයද ස්ථිරසාර සංවර්ධනය කෙරෙහි අභ්‍යන්තරික වශයෙන් ඇති කරනු ලබන අභියෝගයකි.

ආදිවාසී ප්‍රජාවගේ අනන්‍යතාව සහ සුභසාධනය අරමුණු කොටගෙන සම්පාදනය කරනු ලබන ප්‍රතිපත්තිවලදී දේශීය ඥානය භාවිතයට ගැනීමේ ප්‍රවණතාව අතිශය අවමය. බොහෝ දුරට නිලබලවාදී ආකෘතියක් තුළ ගනු ලබන තීරණවල නාගරික පක්ෂපාතීත්වයක් පවතියි. ආදිවාසී ප්‍රජාවද මහා සමාජයෙහිම කොටසක් වශයෙන් සැලකිය යුතු වන්නේ ප්‍රධාන ප්‍රවාහයේ සමාජ කණ්ඩායම්වල

ISSN 2756-925X ISSN 0236-2090
CC BY NC

සුභසාධනය කෙරෙහිද එයින් යම්කිසි බලපෑමක් සිදු වන බැවින්ය. මේ හේතුවෙන්, 2030 න්‍යාය පත්‍රයට සාපේක්ෂ වශයෙන් සුභසාධන ප්‍රතිපත්ති සකස් කිරීමෙහිදී කවර පාර්ශ්වයකගේ අදහස් ප්‍රධානස්ථානයකට පත් වන්නේ ද? යන්න ප්‍රධාන ගැටලුවක් බවට පත් වේ. සංවර්ධනය වෙමින් පවතින ලෝකයෙහි පරිපාලන ක්‍රියාවලිය වෙසෙසින් දේශපාලනීකරණය වීම ප්‍රධාන ලක්ෂණයකි. එසේ වුවත්, දැනුම පදනම් කරගත් ඇතැම් නිලධාරීන්ගේ ආධිපත්‍යයක් වර්ධනය වීම දේශපාලනික අභිනතිවලට සාපේක්ෂව අධික බලපෑමක් සිදු කරයි. ආදිවාසී ප්‍රජාව නවීන අගය සහිත දැනුමකින් යුක්ත නොවන බවත්, දැනුමක් සහිත ආදිවාසී සමාජවලින් බැහැර ප්‍රධාන ප්‍රවාහයේ සමාජ කණ්ඩායම් දැනුමකින් යුතු වැදගත් සමූහයක් වශයෙන්ද නිරූපණය කරනු ලැබේ. සාධාරණත්වය පදනම් කොටගත් සුභසාධනයක් ස්ථාපනය කිරීම කෙරෙහි මෙම තත්ත්වය ඍණාත්මකව බලපෑම් කරයි.

සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ ළඟා කර ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සමාජය සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළත්, ඇතැම් සමාජ කණ්ඩායම්වල සුවිශේෂී අවශ්‍යතා සංතෘප්ත කිරීම සඳහා යොමු කරන ලද අවධානය ප්‍රමාණවත් නොවේ. ආදිවාසී සමාජ ව්‍යුහමය වශයෙන් වියුක්ත සමාජ කණ්ඩායමක් වශයෙන් ව්‍යවහාර වුවත්, එය සමස්ත සමාජයෙහිම එක් අංශයකි. එසේ වුවත්, සමස්ත සමාජය කෙරෙහි අදාළ වන ප්‍රතිපත්තිමය නියම සුවිශේෂ කණ්ඩායම්වල සංවර්ධනය සඳහාද භාවිත කිරීම ප්‍රායෝගික නොවේ. පසුගිය දශක කිහිපය තුළ ආදිවාසී සමාජ ආශ්‍රිත සුභසාධනය සඳහා යම්කිසි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වුවත් එහි බහුවිධ විසමතා සහ දුර්වලතා හඳුනාගෙන තිබේ. එබැවින්, 2030 න්‍යාය පත්‍රයට සාපේක්ෂව ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු වන්නේ පූර්ව වශයෙන් පරිපාලනයකට භාජනය කරන ලද ප්‍රජාව ආශ්‍රිතවය. මෙය පුළුල් අභියෝගාත්මක අවස්ථා ඉස්මතුවීමට හේතුවක් වෙයි. ප්‍රතිපත්ති පාදක සංවර්ධනයක් සඳහා කිසිසේත් යොමු නොවූ සමාජයවලට වඩා ප්‍රතිපත්ති මගින් සැලකිය යුතු වෙනසක් ඇති කරන ලද සමාජ ක්‍රමයක් තුළ නැවතත් සමාජ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිදී වඩාත් සැලකිමත් විය යුතු වන්නේ එබැවින්ය.

**නිගමනය**

2030 න්‍යාය පත්‍රය මගින් තිරසර සංවර්ධන අභිමතාර්ථ ස්ථාපනය කිරීම පිළිබඳ කතිකාව ඇති විය. සංවර්ධනය වෙමින් පවතින සමාජ එහිදී පෙරමුණ ගත යුතු බවද අවධාරණය කරනු ලැබේ. ශ්‍රී ලංකාව වැනි බහුවිධ විසමතා සහිත සමාජ ක්‍රමයක් තුළ එවැනි පරමාර්ථ ළඟා කර ගැනීම සම්බන්ධ නෛසර්ගික ගැටලු සමුදායක් සමාජ ව්‍යුහය තුළම පවතියි. විශේෂයෙන්ම ආදිවාසී සමාජ වැනි සුවිශේෂ සමාජ කණ්ඩායම්ද සාධාරණත්වයක් සහිත සංවර්ධනයක් සඳහා සම්බන්ධ කර ගැනීම පහසු කාර්යයක් නොවේ. මේ අනුව තිරසර සංවර්ධන පරමාර්ථ පදනම් කොටගත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිදී ශ්‍රී ලංකා සමාජය මුහුණ දෙනු ලබන අභියෝගයන් මෙම අධ්‍යයනයෙහිදී විමර්ශනය කරනු ලැබිණ.

සමාජ සංවර්ධනය අභිමුඛ කොටගත් සමාජ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිදී සමාජගත බහුවිධ කණ්ඩායම් එයින් බලපෑමකට භාජනය වන්නේ විවිධ ආකාරයෙනි. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින සමාජ ක්‍රමයක් තුළ ග්‍රාමීය වශයෙන් මුල් බැසගත් ධර්මතා පද්ධති, නව

ISSN 2756-925X ISSN 0236-2090
cc BY NC

සමාජ ප්‍රතිපත්ති සමග අනුකූල වන ආකාරයෙන් සකස්වීම සම්බන්ධයෙන් පැහැදිලි ගැටලු පවතියි. අනෙක් අතට සමාජ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමෙහිදී කවුරුන් විසින් නිර්දේශ කරන ලද අගය, ඥාන පද්ධති, ප්‍රමුඛතා සහ සමාජ ආර්ථික අවශ්‍යතා පදනම් කොටගෙන තිබේද? යන්න පිළිබඳවද ගැටලුවක් පවතියි. නාගරික වශයෙන් නවීකරණයට භාජනය වූ සමාජවලට සාපේක්ෂ වශයෙන් සරල හෝ ප්‍රාථමික සමාජ මෙවැනි ප්‍රතිපත්ති කෙරෙහි අනුගතවීම හෝ අනුගත කරවීම තුළින්ද සාධාරණය සහ සමානතාව පදනම් කොටගත් සමාජ සංවර්ධනයක් ඇති කිරීම සම්බන්ධ ගැටලු ඉස්මතු කරයි.

සමාජ ක්‍රමයෙහි අපේක්ෂා සහ සමාජ ප්‍රතිපත්තිවල අපේක්ෂා අතර සමමිතියක් නොපෙන්වීමද ප්‍රධාන ගැටලුවක් වශයෙන් හඳුනාගනු ලැබිණ. ප්‍රතිපත්ති මගින් අපේක්ෂිත අනාගත අභිමතාර්ථ සහ සමාජ ක්‍රමය මගින් නිර්දිෂ්ට අභිමතාර්ථ අතරද සමාන්තරභාවයක් දක්නට නොලැබේ. සමාජ සහ පාරිසරික ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබන රාජ්‍ය පරිපාලනය සහ දේශීය වශයෙන් සරල සමාජවල පරිපාලන බල දේශපාලනය අතරද යම්කිසි පරස්පර සම්බන්ධතාවක් පවතින බවක් පෙනේ. අන්‍යෝන්‍ය වශයෙන් පවතින පරස්පර සම්බන්ධතා, ස්ථිරසාර සංවර්ධන අභිමතාර්ථ ක්‍රියාත්මක කිරීමෙහිදී නොවැළැක්විය හැකි අභියෝගයක් බවට පත් වන්නේ එබැවින්ය.

සංවර්ධනය වෙමින් පවතින සමාජවලත්, ඇතැම් සුවිශේෂ සමාජ කණ්ඩායම්වල සුභසාධනය සහ සාධාරණ සමාජ සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වන්නේ හුදෙක් ව්‍යාප්ත ප්‍රතිපත්ති මගින් සුවිශේෂ අපේක්ෂා සහ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමේ සම්භාවිතාව සාපේක්ෂ වශයෙන් අවම වන බැවින්ය. ස්ථිරසාර සංවර්ධන පරමාර්ථ පදනම් කොටගෙන සමාජ ප්‍රතිපත්ති සම්පාදනය මගින් අවසාන විග්‍රහයෙහිදී, පවතින සමානාත්මතාව සහ සාධාරණත්වය අවමකරණයකට භාජනය නොකොට ප්‍රජාව විසින් අපේක්ෂිත සමාජ සංවර්ධනයක් සඳහා අවස්ථා නිර්මාණය කිරීමක් සිදු විය යුතුය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

Absolon, K. E., (2016).'Wholistic and ethical: Social inclusion with Indigenous peoples': *Social Inclusion*, 4(1), pp. 44–56. doi: 10.17645/si.v4i1.444.

Agyeman, J.. (2004) . 'Just Sustainability: The Emerging Discourse of Environmental Justice in Britain?': *The Geographical Journal*, 170(2), pp. 155–164.

Belda-Miquel, S., Boni, A. and Calabuig, C., (2019). 'SDG Localisation and Decentralised Development Aid: Exploring Opposing Discourses and Practices in Valencia's Aid Sector', *Journal of Human Development and Capabilities*, 20(4), pp. 386–402. doi: 10.1080/19452829.2019.1624512.

Bhuyan, N., (2017). 'Sustainable Development and the Agenda of Global Social Justice', in *Essays on Sustainability and Management*. New York: Springer, pp. 19–31. doi:

ISSN 2756-925X ISSN 0236-2090
cc BY NC

10.1007/978-981-10-3123-62.

Birks, M. and Mills, J., (2019). 'Rendering Analysis through Storyline', in Bryant, A. and Charmaz, K. (eds) *The Sage Handbook of Grounded Theory*. 2nd edn. London: SAGE Publication Ltd, pp. 243–258.

Braun, V. and Clarke, V.,(2006). 'Using thematic analysis in psychology', *Qualitative Research in Psychology,* 3(2), pp. 77–101. doi: 10.1191/1478088706qp063oa.

Breslow, S. J. *et al,.,* (2017). 'Evaluating indicators of human well-being for ecosystem-based management*', Ecosystem Health and Sustainability.* Taylor and Francis Ltd., 3(12), pp. 1–18. doi: 10.1080/20964129.2017.1411767.

Brooks, J. S., (2013). 'Avoiding the Limits to growth: Gross national happiness in bhutan as a model for sustainable development*', Sustainability (Switzerland)*, 5(9), pp. 3640–3664. doi: 10.3390/su5093640.

Brown, R., (1952). *Structure and Function in Primitive Society*. Glencoe: The Free Press.

Campbell, S. D., (2013). 'Sustainable Development and Social Justice: Conflicting Urgencies and the Search for Common Ground in Urban and Regional Planning', *Michigan Journal of Sustainability*. University of Michigan Library, 1(20181221). doi: 10.3998/mjs.12333712.0001.007.

CFSD .,(2017). *What is Sustainable Community Development*. Centre for Sustainable Community Development. Available at: http: //www.sfu.ca/sustainabledevelopment/about-us/what-is-sustainable-community-development.html (Accessed: 12 June 2020).

Chambers, R., (1983). *Rural Development: Putting the Last First*. New York: Longman.

Chambers, R., (1997). *Whose reality counts?*. London: ITGD Publishers.

Christenson, J. A. and Robinson, J. W., (1989). *Community Development in Perspective*. Ames Iowa: Iowa State University Press.

Cornell, S. and Jorgensen, M., (2019).'What are the Limits of Social Inclusion? Indigenous Peoples and Indigenous Governance in Canada and the United States', *American Review of Canadian Studies*. Routledge, 49(2), pp. 283–300. doi: 10.1080/02722011.2019.1613790.

ISSN 2756-925X ISSN 0236-2090
CC BY NC

Cultural Survival of Sri Lanka., (1994). *Sri Lanka's Indigenous Wanniya-laeto: A Case History*, *Report to Sri Lanka's National Committee for the International Decade of the World's Indigenous People*. Available at: http://vedda.org/vedda_hamlets_map01.htm. (Accessed: 26 May 2019).

Deacon, B., (2016). 'SDGs, Agenda 2030 and the prospects for transformative social policy and social development': *Journal of International and Comparative Social Policy*. Routledge, pp. 79–82. doi: 10.1080/21699763.2016.1200112.

De Silva, D. A. P. and Punchihewa, A. G., (2011). *Socio- Anthropological Research Project on Vedda Community in Sri Lanka*. Colombo: University of Colombo.

Desai, V. and Potter, R. B., (2011). *The Companion to Development*. London: Hodder Education.

Dove, M. R., (2006). 'Indigenous People and Environmental Politics': *Annual Review of Anthropology.* Annual Reviews, 35(1), pp. 191–208. doi: 10.1146/annurev.anthro.35.081705.123235.

Ember, C. R. and Ember, M., (2015). *Cultural Anthropology*. Boston: Pearson.

Escobar, A., (2005). *Encountering Development : The Making and Unmaking of the Third World*. New Jersy: Prinston University Press.

Esping-Andersen, G., (2015). 'Welfare regimes and social stratification': *Journal of European Social Policy*. SAGE Publications Ltd, 25(1), pp. 124–134. doi: 10.1177/0958928714556976.

Fortes, M. and Pritchard, E. E. E., (1940). *African Political Systems*. New York: Oxford University Press.

Foster, G. M. (1965).' Peasant Society and the Image of Limited Good': *American Anthropologist*. WileyAmerican Anthropological Association, 67(2), pp. 288–297. doi: 10.4324/9780203786598-26.

Gibbon, P.,(1997). 'Civil Society, Politics and Democracy in Developmentalist States', *in Social Movements in Development.* Palgrave Macmillan UK, pp. 78–98. doi: 10.1007/978-1-349-25448-45.

Giddens, A., (1984). *The Constitution of Society*. Cambridge: Polity Press.

Goosen, M. F. A., (2012). 'Environmental Management and Sustainable Development', in *Procedia Engineering*. Elsevier, pp. 6–13. doi: 10.1016/j.proeng.2012.01.1171.

Gross, C., (2010). *Water under the bridge: fairness and justice in environmental decision-making*, *Department of Sociology*. The Australian National University. Available at: http://dspace-prod1.anu.edu.au/handle/1885/49419(Accessed: 12 June 2020).

Heinämäki, L., (2010). *The Right to Be a Part of Nature: Indigenous Peoples and the Environment*. University of Lapland. Available at: https://core.ac.uk/download/pdf/30083904.pdf (Accessed: 12 June 2020).

Honer, A. and Hitzler, R., (2015). 'Life-World-Analytical Ethnography', *Journal of Contemporary Ethnography*. Edited by D. vom Lehn and R. Hitzler. SAGE PublicationsSage CA: Los Angeles, CA, 44(5), pp. 544–562. doi: 10.1177/0891241615588589.

Jenson, J. and Papillon, M., (2000). 'Challenging the Citizenship Regime: The James Bay Cree and Transnational Action', *Politics and Society*, vol. 28(2), pp, 245-264.

Jeremy, S., (1993). *Victims of Development: Resistance and Alternatives*. London: Verso.

Jones, J. and Pandey, R., (1981). *Social Development: Conceptual, Methodological and Policy Issues*. New York: St. Martin's Press.

Koehler, G., (2016). '*A*ssessing the SDGs from the Standpoint of Eco-Social Policy: Using the SDGs Subversively', *Journal of International and Comparative Social Policy.* Routledge, 32(2), pp. 149–164. doi: 10.1080/21699763.2016.1198715.

Kwon, H., (2017).' Implications of the Sustainable Development Goals for Global Social Policy', *Global Social Policy: An Interdisciplinary Journal of Public Policy and Social Development*. SAGE Publications Ltd, 17(2), pp. 206–209. doi: 10.1177/1468018117703439.

Lindberg, S., (1997). 'Farmers' Movements and Agricultural Development in India', in *Social Movements in Development*. Palgrave Macmillan UK, pp. 101–125. doi: 10.1007/978-1-349-25448-4_6.

Lorelli S. Nowell, Jill M. Norris, Deborah E. White, N. J. M., (2017). 'Thematic Analysis:

ISSN 2756-925X ISSN 0236-2090
CC BY NC

Striving to Meet the Trustworthiness Criteria':International Journal of Qualitative Methods, 16, pp. 1–13. doi: 10.1177/160940691773384

Mansuri, G., Rao, V. and Bank, T. W., (2013). *Localizing Development: Does Participation Work*. Washington: International Bank for Reconstruction and Development.

McCreanor, T. and Nairn, R., (2002). 'Tauiwi general practitioners' explanations of Maori health: Colonial relations in primary healthcare in Aotearoa/New Zealand?', *Journal of Health Psychology*, 7(5), pp. 509–518. doi: 10.1177/1359105302007005670.

Midgley, J., (2014). *Social Development: Theory and Practice*. London, England: SAGE.

Midgley, J. and Pawar, M., (2017). *Future Directions in Social development*. New York: Palgrave Macmillan. doi: https://doi.org/10.1057/978-1-137-44598-8. (Accessed: 26 May 2019)

Moran, D., (2000). *Introduction to Phenomenology*. London: Routledge.

Myrdal, G., (1957). *Economic Theory and Under Developed Regions*. London: Gerald Duckworth and Co. ltd.

Nandy, A., (1989). *Traditions, Tyranny, and Utopias*. Delhi: Oxford University Press .

O'donnell, G. *et al.,* (2014). *Wellbeing and Policy*. Mayfair, London. Available at: https:/ www.li.comwww.prosperity.com (Accessed: 12 June 2020).

Oommen, T. K., (1997). 'Social Movements in the Third World', in *Social Movements in Development*. Palgrave Macmillan UK, pp. 46–66. doi: 10.1007/978-1-349-25448-4_3.

Parsons, T., (1971). *The System of Modern Societies*. NJ: Prentice Hall.

Pawar, M., (2014). *Social and community development practice*. New Delhi: SAGE. Available at: https://in.sagepub.com/en-in/sas/social-and-community-development-practice/book243852 (Accessed: 26 May 2019).

Penney, L., Barnes, H. M. and Mccreanor, T., (2011). 'The Blame Game: Constructions of Māori medical compliance', *AlterNative: An International Journal of Indigenous Peoples*. SAGE PublicationsSage UK: London, England, 7(2), pp. 73–86. doi: 10.1177/117718011100700201.

ISSN 2756-925X ISSN 0236-2090

Peters, E. J., (1999). 'Native people and the environmental regime in the James Bay and Northern Quebec Agreement', *Arctic*. Arctic Institute of North America, 52(4), pp. 395–410. doi: 10.14430/arctic944.

Reeves, S., Kuper, A. and Hodges, B. D., (2008). 'Qualitative research methodologies: ethnography', *BMJ (Clinical research ed.)*. British Medical Journal Publishing Group, 337, p. a1020. doi: 10.1136/BMJ.A1020.

Richardson, B. J., (2011). 'The Ties that Bind: Indigenous Peoples and Environmental Governance', *SSRN Electronic Journal*. Elsevier BV. doi: 10.2139/ssrn.1262781.

Rogoff, B. *et al.,* (2003) .'First Hand Learning through Intent Participation', *Annual Review of Psycholology*, 54, pp. 175–203.

Schejtman, A. (1997). 'Peasants and Structural Adjustment in Latin America' , in *Social Movements in Development*. Palgrave Macmillan UK, pp. 126–152. doi: 10.1007/978-1-349-25448-4_7.

Seligman, C. G., (1911). *The Veddas*. Cambridge: Cambridge University Press. Available at: https://archive.org/details/veddas00seliuoft/page/n8 (Accessed: 19 January 2020).

Sengupta, M. (2015). 'Obstacles to the use of indigenous knowledge', *Development in Practice*. Routledge, 25(6), pp. 880–894. doi: 10.1080/09614524.2015.1064861.

Shamsul Haque, M., (2010). 'Rethinking development administration and remembering Fred W. Riggs', *International Review of Administrative Sciences*. SAGE PublicationsSage UK: London, England, 76(4), pp. 767–773. doi: 10.1177/0020852310394320.

Shiva, V., (1991). 'Ecology and the Politics of Survival'*, Conflicts over natural Resources in India*. New Delhi: Sage.

Shiva, V., (2005). *Earth Democracy*. London: Zed Books.

Tom, M. N., Sumida Huaman, E. and McCarty, T. L. (2019). 'Indigenous knowledges as vital contributions to sustainability', International Review of Education. Springer Netherlands, 65(1), pp. 1–18. doi: 10.1007/s11159-019-09770-9.

Tsosie, R. . A., (2009). 'Indigenous People and Environmental Justice'*, The Impact of Climate*

*Change*, *University of Colorado Law Review*, 78(1), pp. 1625–2007. Available at: https://papers.ssrn.com/sol3/papers.cfm?abstract_id=1399659(Accessed: 26 May 2019).

UN., (2015). '*Transforming Our World':* The 2030 Agenda For Sustainable Development. New-York: United Nations, p. 41. Available at: https://sustainabledevelopment.un.org/content/documents/21252030 Agenda for Sustainable Development web.pdf(Accessed: 26 May 2019).

UN., (2017). *The Sustainable Development Agenda*. New-York: United Nations . Available at: http://www.un.org/sustainabledevelopment/development-agenda/#8e74e7178ec1f94c8. (Accessed: 26 May 2019).

UNDP., (2017). *Human Development Report 2016: Human Development for Everyone*. New York: United Nations Development Programme. Available at: http://hdr.undp.org/sites/default/files/2016_human_development_report.pdf(Accessed: 26 May 2019).

UNRISD., (2017). *Implementing the SDGs in all localities and for all communities*. Switzerland. Available at: www.unrisd.org/sse-sdgs-seoul (Accessed: 26 May 2019).

Uphoff, N., (1992). *Learning From Galoya: Possibilities for Participatory Development and Post-Newtonean Social Science*. London: Cornell University Press.

Wang, J. H. and Wang, S. Y., (2019). *Indigenous Social Policy and Social Inclusion in Taiwan, Sustainability (Switzerland)*.11(12), pp. 1–17. doi: 10.3390/su10023458.

Yu, C. Y., (2018). 'An application of sustainable development in indigenous people's revival', *The history of an indigenous tribe's struggle in Taiwan*, *Sustainability (Switzerland)*, 10(9), pp. 1–20. doi: 10.3390/su10093259.

ISSN 2756-925X ISSN 0236-2090